# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
# වාර්ෂික වාර්තාව 2011

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

## වාර්ෂික වාර්තාව 2011

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

වාර්ෂික වාර්තාව 2011

| පටුන | පිටු අංක |
|---|---|
| ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ සමාලෝචනය | 5 |
| දැක්ම සහ මෙහෙවර | 6 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 7 |
| ආයතනික තොරතුරු | 9 |
| කළමණාකරන මණ්ඩලය | 11 |
| අලෙවිකරණ සහ ප්‍රවර්ධන වැඩසටහන් | 12-24 |
| දැන්වීම්කරණය සහ නිෂ්පාදන | 25-27 |
| මහජන සම්බන්ධතා හා මාධ්‍ය ප්‍රචාරණය | 28-29 |
| මානව සම්පත්, පරිපාලනය සහ මූල්‍ය අංශය | 30-57 |

# ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ සමාලෝචනය



2009 වර්ෂයේ මැයි 19 වනදා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් එවකට පැවැති රුදුරු ත්‍රස්තවාදය අවසන් කරමින් සාමය ස්ථාපනය කරනු ලැබීය. එය සංචාරක ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා විශාල ඉදිරි පිම්මක් විය.

ඒ අනුව, ශ්‍රී ලංකාවට සංචාරකයන්ගේ පැමිණීම 2009 වසරේ සිට 2010 වර්ෂය දක්වා 447,890 සිට 654,476 දක්වා ද 2011 වර්ෂය වන විට 855,975 දක්වාද වර්ධනය විය. 2012 වර්ෂයේ දී සමස්ත සංචාරක පැමිණීම් මිලියනය ඉක්මවීමට අපේක්ෂිත අතර, 2016 වන විට මෙකී ඉලක්කය මිලියන 2.5 කි.

සංචාරක කර්මාන්තය සහ එහි දිගුකාලීන තිරසරභාවය රඳා පවතින්නේ, ආර්ථිකයේ අනෙක් අංශ මතය. සංචාරක කර්මාන්තය සඳහා සෘජුව හෝ වක්‍රව දායක වන ව්‍යාපෘති කිහිපයකම මහා පරිමාණයෙන් ආයෝජනය කිරීම රජය විසින් ආරම්භ කොට ඇත. උදාහරණයක් ලෙස, හම්බන්තොට, මත්තල ප්‍රදේශයේ දැනට ඉදිකෙරෙමින් පවතින දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ 2013 වර්ෂයේ දී නිම කිරීමට නියමිතය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ද අලුත්වැඩියා කෙරෙමින් සහ වැඩිදියුණු කෙරෙමින් පවතී. අපගේ මහාමාර්ග සහ දුම්රිය මාර්ග සකස් කිරීමේ කාර්යය දැනටමත් රජය විසින් ආරම්භ කොට තිබේ. කොළඹ සහ ගාල්ල අතර ශ්‍රී ලංකාවේ පළමු අධිවේගී මාර්ගය 2011 නොවැම්බර් මස 27 වනදා විවෘත කෙරිණ. 2011 වර්ෂයේ ඔක්තෝබර් 07 වනදා මහනුවර- කොළඹ නගරාන්තර දුම්රියට අධි සුඛෝපභෝගී මැදිරියක් එක් කෙරිණ. කොළඹ පැරණි ඕලන්ද රෝහල සාප්පු සංකීර්ණයක් සහ භෝජනාගාරයක් බවට පත් කෙරිණ. නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල 2011 දෙසැම්බර් මස 15 වන දින නවීන තාක්ෂණයෙන් සමන්විතව ඉදිකරනු ලැබූ අතර, එහි සමස්ත ආසන සංඛ්‍යාව 1288 කි.

2012 වර්ෂය වන විට සංචාරක කර්මාන්තය ඩොලර් බිලියන ගණනක විදේශ විනිමය රටට උපයා දෙන කර්මාන්තයක් බවට පත්ව ඇත.

සංචාරක කර්මාන්තයේ ඉහළ නැඟීම තුළින් ශ්‍රී ලාංකිකයන්ට රැකියා අවස්ථා රැසක් හිමිව ඇත. අද වන විට මුළු රටම සංචාරක කර්මාන්තයට විවෘතව පවතින අතර, උතුරු සහ නැගෙනහිර පළාත්

ද ඇතුළත්ව සංචාරකයන්ට රටේ ඕනෑම ස්ථානයක් නැරඹීමට යා හැකිය.

අපගේ ඒකායන අභිප්‍රාය වන්නේ ශ්‍රී ලංකාවේ සෑම කොටසකම සිටින ජනතාවට ප්‍රතිලාභ සැලසෙන පරිදි සංචාරක කර්මාන්තය ඉදිරියට රැගෙන යාමයි.

**<u>දැක්ම</u>**

'ශ්‍රී ලංකාව, එහි වූ සුන්දර වෙරළ තීර, උණුසුම් සහ සුහදශීලී ජනතාව සහ එය සතු අග්‍රගණ්‍ය ස්වාභාවික, සංස්කෘතික සහ වික්‍රමාන්විත අත්දැකීම් සමග, ආසියාවේ සංචාරක සන්ධිස්ථානය බවට පත්කර එය සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් සඳහා මෙන්ම ශ්‍රී ලංකාවාසී ජනතාවට ද ප්‍රතිලාභ ලබා දෙන විශාලතම විදේශ විනිමය උපයන්නා වශයෙන් සංවර්ධනය කර, ශ්‍රී ලංකාව ආසියාවේ ප්‍රමුඛතම සහ ඉතාමත් හරිත දිවයින වශයෙන් ස්ථාපනය කොට ස්ථානගත කිරීම.'

**<u>මෙහෙවර</u>**

- අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ඉහළ නැංවීම සහ නඩත්තු කිරීමේ ලා දායක වීම
- සංචාරකයන්ගේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳව අවධානය යොමු කරමින්, සංචාරකයන් සන්තුෂ්ටියට සහ ප්‍රමෝදයට පත්කිරීම අරමුණු කොටගත් ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු නිෂ්පාදන ස්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම.
- සංචාරක කර්මාන්තයට කෙරෙන ආයෝජන පරිමාණය සහ ඒවායේ තිරසරභාවය පවත්වාගැනීම සඳහා සංචාරකයන් උත්පාදනය කෙරෙන ප්‍රමාණය සහ එහි ධාරිතාව තහවුරු කිරීම.
- කාබන් විමෝචනය අවම කර, ශ්‍රී ලංකාව ශක්‍යතාවයක් සහිත පාරිභෝගිකයන් අතර ඉහළ පිළිගැනීමක් සහිත ප්‍රමුඛ දිවයිනක් බවට පත්කිරීම.
- වෘත්තීමයභාවය, නිපුණතා සංවර්ධනය සහ පුහුණුවීම් සංවර්ධනය මගින් කර්මාන්තයේ මානව සම්පත් අවශ්‍යතා සපුරා ගැනීම.
- ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා, කර්මාන්තය තුළ මෙන්ම කර්මාන්තයෙන් බාහිරව සිටින්නා වූ  නිල මෙන්ම නිල නොවන අංශ නියෝජනය කරන්නාවූ ද සියලු පාර්ශ්වකරුවන් සහභාගී කරවා ගැනීම.
- ශ්‍රී ලාංකිකයන්ගේ ගමනාගමන අවශ්‍යතා සඳහා ලබාදෙන සේවය වැඩිදියුණු කරමින් දේශීය සංචාරක කර්මාන්තය පුළුල් කරමින් එනයින් ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

# සභාපතිතුමාගේ පණිවිඩය



2011 වර්ෂයේදී සංචාරකයන්ගේ පැමිණීම සියයට 30.8 කින් වර්ධනය විය. ඉන්දියාව මෙරටට සංචාරකයන් වැඩිම ප්‍රමාණයක් උත්පාදනය කරන ලද රට වූ අතර, එක්සත් රාජධානිය සහ ජර්මනිය පිළිවෙලින් දෙවැනි සහ තුන්වැනි ස්ථානයට වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් ආකර්ෂණය කරගන්නා ලද රටවල් අතර විය.

සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා වත්මන් ශ්‍රී ලංකාව සතුව විශිෂ්ට පරිසරයක් පවතී. වත්මන් රජය විසින් පශ්චාත් යුද්ධ වාතාවරණය තුළ සංචාරක ක්ෂේත්‍රය සලකනු ලබන්නේ ප්‍රමුඛතා අංශයක් වශයෙනි.

වර්ෂ 2005 අංක 38 දරන සංචාරක පනතේ විධිවිධානයන්හි  6 (2) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2011-2016 සංචාරක සංවර්ධන ක්‍රමෝපාය සැකසූ අතර, එය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබා ගැනිණ.

එහි ප්‍රධාන අරමුණු වන්නේ :

- 2010 වසරේදී 654,476ක් වූ සංචාරක පැමිණීම් 2016 වසරේදී මිලියන 2.5 දක්වා ඉහළ නැංවීම
- වසර 5 ක් තුළ සෘජු විදේශ ආයෝජන වශයෙන් ඇ.ඩො මිලියන 3000ක ආයෝජන ශ්‍රී ලංකාව කරා ආකර්ෂණය කර ගැනීම
- සංචාරක කර්මාන්තය මත පදනම් වූ 2010 වසරේ 125,000 ක් වූ රැකියා අවස්ථා 2016 වසර වන විට 500,000 දක්වා ඉහළ නැංවීම සහ දිවයින පුරා සංචාරක කර්මාන්තය මත පදනම් වූ කර්මාන්ත සහ සේවාවන් වැඩිදියුණු කිරීම
- සංචාරක කර්මාන්තයේ ප්‍රතිලාභ සමාජයේ වැඩි පිරිසක් වෙත ලැබීමට සැලැස්වීම සහ සංචාරක කර්මාන්තය මූර්ත ආර්ථිකයට ඒකාබද්ධ කිරීම
- 2010 වසරේ ඇ.ඩො මිලියන 500 ක් වූ විදේශ විනිම ඉපැයීම 2016 වසර වන විට ඇ.ඩො බිලියන 2.75 ක් දක්වා වූ විදේශ විනිම ඉපැයීමක් දක්වා ඉහළ නැංවීම

- ශ්‍රී ලංකාවේ ගෝලීය වෙළඳාම සහ ආර්ථික සම්බන්ධතා වැඩිදියුණු කිරීම සඳහා දායක වීම
- ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තය සඳහා ලෝකයේ ප්‍රමුඛතම දිවයින වශයෙන් ස්ථානගත කිරීම

සංචාරක කර්මාන්තය දිගින් දිගටම දියුණුවන බවත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් එය මෙරට ජනතාවට තම ආර්ථිකය ගොඩනංවා ගැනීමට සහ ජීවන තත්වය ඉහළ නංවා ගැනීමට මහෝපකාරී වනු ඇති බවත් අපගේ විශ්වාසයයි.

## ආයතනික තොරතුරු

**ආයතනයේ නම** - ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

**නීතිමය ස්වභාවය** - වර්ෂ 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ සංස්ථාපිත ආයතනයකි. (වර්ෂ 2005 අංක 38 දරන නව සංචාරක පනත බලාත්මක වූයේ 2007 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිටය. අංක 38 දරන සංචාරක පනත මගින් වර්ෂ 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත අහෝසි කරනු ලැබීය. ඒ අනුව, 2007 වසරේ සැප්තැම්බර් මස 30 වන දින සිට ක්‍රියාත්මක වූ පරිදි, ලංකා සංචාරක මණ්ඩලයේ මෙහෙයුම් අත්හිටුවන ලදී. එවකට පැවැති සංචාරක මණ්ඩලයේ සංචාරක ප්‍රවර්ධන කටයුතු ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය යටතට ගැනිණ.)

**කාර්යාල** - ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ, කොළඹ 03, ගාලු පාර, අංක 80 දරන ස්ථානයේය ( බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ, කටුනායක, මහනුවර සහ සීගිරිය යන ස්ථානයන්හි සංචාරක තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපනය කර ඇත)

**විගණනය කිරීම** - ශ්‍රී ලංකා විගණකාධිපති

**බැංකුකරු** - ලංකා බැංකුව

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ භූමිකාව - ශ්‍රී ලංකා සංචාරක අත්දැකීම් සඳහා තිරසර ජාත්‍යන්තර ඉල්ලුම පවත්වා ගැනීම සහ

- පැහැදිලි ගමනාන්ත අලෙවිකරණ ක්‍රමෝපායක් සකස්කිරීම සහ එය සාර්ථකව ක්‍රියාත්මක කිරීම;
- තරගකාරීත්වය තුළින් නිතරගයෙන් ක්‍රමෝපායිකව ඉස්මතුවන, ආකර්ෂණීය ගමනාන්ත වෙළඳ නාමයක් නිර්මාණය කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම;
- සාම්ප්‍රදායික සහ අන්තර්ජාලය ඔස්සේ ඉස්මතුවන බෙදාහැරීමේ ජාලයන්ට සහය වෙමින් සහ ඒවා යොදා ගනිමින්, සංචාරකයන් පැමිණීමේ සහ ඉපැයීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අලෙවිකරණ සම්පාදනය;
- ඉලක්කගත වෙළඳපොළ කොටස්වල අවශ්‍යතා සහ අපේක්ෂාවන්ට අනුව ශ්‍රී ලංකාවට ආවේණික වූ සංචාරක අත්දැකීම් හඳුනාගැනීම සහ සහය වීම;
- ශ්‍රී ලංකා සංචාරක නිෂ්පාදන, සේවා සහ එකී වෙළඳ නාමයේ සියලු කොටස් වෙළඳ නාමයට මෙන්ම වෙළඳනාම ස්ථානගත කිරීමේ ක්‍රමෝපායන්ට සරිලන්නේ යැයි තහවුරු කිරීම;
- වඩාත් හොඳ තීරණ ගැනීම සඳහා, ප්‍රමුඛ පෙළේ සියලු වෙනස්කම් සහ ප්‍රවණතා ඒකරාශි කරමින් වෙනස්වන ජාත්‍යන්තර සංචාරක කර්මාන්ත පසුබිම අධ්‍යයනය කරමින්, ව්‍යාපාර සැලසුම් සහ සංවර්ධනය කිරීම පිණිස, ඒවා අදාළ කර්මාන්ත පාර්ශ්වකරුවන් වෙත දැන්වීම ; සහ

- ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සම්පාදනය කළ හැකි සහ සහයවිය හැකි ආයතන සමග සමීපව කටයුතු කිරීම.

මගින් ශ්‍රී ලංකා සංචාරක නිෂ්පාදනය ලබාදීමේදී සහ එකී සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙත සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ප්‍රතිලාභ ලබාදීමේදී, ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය වෙත උද්යෝගීභාවය, ඒකරාශී සහ සහයෝගය ලබාදීම.

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විමසමින්, සංචාරක සංවර්ධන සැලසුමට අනුකූලව, ගුණාත්මකභාවයෙන් යුතු ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සෘජුව හෝ වක්‍රව අලෙවි සහ ප්‍රවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයට දොරටුවක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාව කලාපීය විශිෂ්ට සංචාරක සංවර්ධන සහ කළමනාකරණ කේන්ද්‍රස්ථානයක් වශයෙන් කීර්තියට පත්කිරීම

## කළමනාකරණ මණ්ඩලය

### 1. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

| තනතුර | අංශය | සම්පූර්ණ නම | වත්මන් තනතුරෙහි සේවා කාලය - ආරම්භක සහ අවසාන දින |
|---|---|---|---|
| සභාපති | ශ්‍රීලං.ස.ප්‍ර.කා සහ ශ්‍රීලං.ස.ස.අ. | ආචාර්ය නාලක ගොඩහේවා | 2011 ජනවාරි 1 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා |
| වැඩබලන, කළමනාකරණ අධ්‍යක්ෂ<br><br>කළමනාකරණ අධ්‍යක්ෂ | ශ්‍රීලං.ස.ප්‍ර.කා<br><br>ශ්‍රීලං.ස.ප්‍ර.කා | එම්.බී. කිරිඇල්ල මහතා<br><br>රූමි ජවුෆර් මහතා | 2011 ජනවාරි 1 දින සිට 2011 මැයි මස 16 දින දක්වා<br>2011 මැයි මස 16 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා |
| වැඩබලන, අලෙවිකරණ අධ්‍යක්ෂ | ශ්‍රීලං.ස.ප්‍ර.කා | මධුභානි පෙරේරා මෙනෙවිය | 2011 ජනවාරි 1 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා |

### 2. පාලක මණ්ඩලයේ සාමාජිකයෝ


| තනතුර | සම්පූර්ණ නම | වත්මන් තනතුරෙහි සේවා කාලය - ආරම්භක සහ අවසාන දින |
|---|---|---|
| සභාපති | ආචාර්ය, නාලක ගොඩහේවා | 2011 ජනවාරි 1 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා |
| පාලක මණ්ඩල සභික | සීනිවාසගම් කලෛසෙල්වම් මහතා | 2011 ජනවාරි 1 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා |
| පාලක මණ්ඩල සභික | ආචාර්ය, බී.එම් සුනෙත් බටගොඩ මහතා | 2011 ජනවාරි 1 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා |
| පාලක මණ්ඩල සභික | භාශ්වර එස් ගුණරත්න මහතා | 2011 ජනවාරි 1 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා |
| පාලක මණ්ඩල සභික | නිල්මින් නානායක්කාර මහතා | 2011 ජනවාරි 1 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා |
| පාලක මණ්ඩල සභික | මර්වින් ප්‍රනාන්දුපුල්ලේ මහතා | 2011 ජනවාරි 1 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා |

## 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

''සිත් ඇද ගන්නා සහ ඒකාබද්ධ ශ්‍රී ලංකාවක නව මුහුණුවර ප්‍රදර්ශනය කිරීම''

ගෝලීය සංචාරකයන් අතර ශ්‍රී ලංකාව ජනප්‍රිය ගමනාන්තයක් වශයෙන් පෙන්වාදීම සඳහා ශ්‍රීලං.ස.ප්‍ර.කා විසින් සිය අලෙවිකරණ සහ ප්‍රවර්ධන වැඩසටහන් යොදා ගැනිණි. ශ්‍රී ලංකාවට වැඩියෙන්ම සංචාරකයන් පැමිණෙන රටවල ශ්‍රී ලංකා සංචාරක වෙළඳ නාමය ජනප්‍රිය කරවීම ශක්තිමත් කරන ලද අතර, ඒ අනුව 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 855,975 ක් විය. මේ අතර, ලොව අන් රටවල ද ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ගොඩනැංවීම සඳහා වැඩසටහන් දියත් කරන ලදී.

**<u>2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවට ප්‍රමුඛ පෙළේ සංචාරකයන් පැමිණෙන රටවලින් පැමිණි සංචාරකයන් ප්‍රමාණය</u>**




වෙළඳපොළ කලාප වශයෙන් ගත් කල්හි, 2011 වර්ෂය තුළ පිළිවෙළින් නැගෙනහිර යුරෝපයෙන් සහ ආසියාවෙන් සියයට 38.7 කින් සහ සියයට 40.6 කින් සංචාරක පැමිණීම් ඉහළ යාමක් පෙන්වීය. මෙකී කාලපරිච්ඡේදය තුළම, උතුරු ඇමෙරිකාව, බටහිර යුරෝපය, අප්‍රිකාව, ඔස්ට්‍රේලාසියාව, ලතින් ඇමෙරිකාව සහ කැරිබියන් යන කලාපයන්ගේ සංචාරක පැමිණීම්වල ද වර්ධනයක් සිදුවිණ.

ඉහත කී කාලය තුළ, ප්‍රංශය - 55.6%, රුසියාව - 61%, චීනය - 56%, ජපානය 43%, ඉන්දියාව 35.1%, නෙදර්ලන්තය - 34%, මැද පෙරදිග 53% ක් වශයෙන් සංචාරක පැමිණීම්වල වර්ධනයන් දක්නට ලැබිණි.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ එන ආයතනයක් වන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, සංචාරක ක්ෂේත්‍රයේ සියලු අලෙවිකරණ සහ ප්‍රවර්ධන කාර්යයන් පිළිබඳව වගකීම් දරන ආයතනයයි. එක්සත් රාජධානියේ අලෙවිකරණ සහ ප්‍රවර්ධන කාර්යයන් මෙහෙයවීම සඳහා එය විසින් එක්සත් රාජධානියෙහි කාර්යාලයක් ද පවත්වාගෙන යනු ලබයි. මීට අමතරව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් විදේශ මෙහෙයුම් යොදාගනිමින් අන් සියලු අලෙවිකරණ සහ ප්‍රවර්ධන කාර්යයන් ද ඉටු කරනු ලබයි.

පහත ස්ථානයන්හි පවත්වන ලද මාර්ග සංදර්ශනවලදී, ශ්‍රී ලංකාව ජනප්‍රිය ගමනාන්තයක් වශයෙන් ප්‍රදර්ශනය කරනු ලැබීය.

| | | | | |
|---|---|---|---|---|
| නිව්යෝක්, | ජර්මනිය, | ඉන්දියාව, | ඩුබායි, | ජපානය |
| ලන්ඩන්, | චීනය, | වියානා, | නෙදර්ලන්තය, | |
| ප්‍රංශය, | රුසියාව, | ඉතාලිය, | ස්වීඩනය | |

## අලෙවිකරණය සහ ප්‍රවර්ධනය

### එක්සත් රාජධානිය

➢ **වෙල්සි මල් දැක්ම, ලන්ඩන් - 2011 මැයි 23 සිට 28 දක්වා**

රාජකීය උද්‍යාන විද්‍යා සමාජය විසින් සංවිධානය කරනු ලැබූ, චෙල්සි මල් දැක්ම මගින්, ශ්‍රී ලංකාව ප්‍රමුඛ ගමනාන්තයක් වශයෙන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙකී ප්‍රදර්ශනයට 157,000 කට වැඩි පිරිසක් සහභාගී වූ අතර, එය මහ රැජිණ ද සහභාගීවූ ගෞරවාන්විත සන්ධ්‍යාවක් වශයෙන් එක්සත් රාජධානි සමාජ දින දර්ශනයේ සටහන් විය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මහා බ්‍රිතාන්‍ය ඕකිඩ් සංගමයේ, ප්‍රදර්ශන පුවරුව සඳහා අනුග්‍රාහකත්වය සැපයීය.

➢ **ලෝක සංචාරක වෙළඳ ප්‍රදර්ශනය - 2011 නොවැම්බර් 7 සිට 10 දින දක්වා**

ලන්ඩන් නුවර එක්සෙල් මධ්‍යස්ථානයේ පැවැත්වූ, ලෝක සංචාරක වෙළඳ ප්‍රදර්ශනය, ලොවපුරා සිටින සංචාර සහ සංචාරක කර්මාන්තයේ නිරතවන්නන් හට අනිවාර්යයයෙන් සහභාගී විය යුතුව තිබූ වෙළඳ ප්‍රදර්ශනයකී. මෙකී ප්‍රදර්ශනයට, සංචාර සංචාරක සහ සත්කාරක අංශයේ නිරතවන ශ්‍රී ලාංකික සමාගම් 49 ක් සමග, 2012 සහ ඉන් අනතුරුව ද එළඹෙන වර්ෂවල ශ්‍රී ලාංකික සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රධාන පණිවිඩය රැගෙන යාම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ද සහභාගී විය.

මෙහිදී ශ්‍රී ලාංකික වෙළඳ කුටිය විවෘත කරනු ලැබුයේ අතිගරු. ආචාර්ය ක්‍රිස් නෝනිස් මහතා සහ කර්මාන්ත පාර්ශ්වකරුවන්ගේ (ශ්‍රී ලංකන් ගුවන් සේවය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, SLAITO, THASL සහ ASMET) නියෝජිතයන් විසිනි. ලෝක රූ රැජිණ තරගය සඳහා ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් වූ පුෂ්පිකා ද සිල්වා මෙනෙවිය ද මීට සහභාගී වීම විශේෂත්වයකි. එමෙන්ම, මෙකී ප්‍රදර්ශනය අතරතුර දී ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ එක්ව කුලීරථ යොදාගෙන කෙරෙන ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාරයක් ද ක්‍රියාත්මක කරන ලදී.

**චීනය**

- **ගුවන්ෂු ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනය සහ ෂෙන්සෙන් සහ ගුවන්ෂු විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් - 2011 මාර්තු 21 සිට 26 දින දක්වා**

ගුවන්ෂු ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනය දකුණු චීනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ එකම සංචාරක ප්‍රදර්ශනය වන අතර, ඒ සඳහා 70,000 ක පිරිසක් සහ 25,000 ක වෙළඳ ගැණුම් කරුවන් සංඛ්‍යාවක් සහභාගී වූහ. මීට සහභාගී වීම මගින් ශ්‍රී ලංකාව පිළිබඳ දැනුවත්භාවය ශක්‍ය චීන සංචාරකයන් අතර සහ සහභාගීවූවන් තුළ ඇති කිරීමට හැකිවූ අතර, ශ්‍රී ලාංකික සංචාර නියෝජිතයන් හට ඔවුන්ගේ චීන සමස්ථානිකයන් මුණගැසීමට ද අවස්ථාවක් හිමිවිණ. මීට ශ්‍රී ලාංකික සමාගම් 6 ක් සහභාගී වූහ.

- **බීජිං ජාත්‍යන්තර සංචාරක දැක්ම, බීජිං - 2011 ජූනි 17 සිට 19 දින දක්වා**

බීජිං ජාත්‍යන්තර සංචාරක දැක්ම බීජිං ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේදී පැවැත්වූ අතර, ඊට 100,000 කට අධික අමුත්තන් ප්‍රමාණයක් සහ 40,000 ක් පමණ වෙළඳ වෘත්තිකයන් පිරිසක් සහභාගී වූහ. සමස්තයක් වශයෙන්, මෙකී ප්‍රදර්ශනයේ රටවල් 80 කට වැඩි ප්‍රමාණයක් සහ චීන ජාතික පළාත් 24 ක් නියෝජනය කෙරිණ.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සහ ශ්‍රී ලාංකීය සංචාරක නියෝජිතායතන 5ක සහභාගීත්වයෙන් යුතුව මෙන්ම බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ද සහාය සහිතව, 2011 විසිට් ලංකා තේමාව, වසරේ මාස 12 ට විශේෂිත වූ තේමා යටතේ ප්‍රවර්ධනය කිරීම සඳහා මූලිකත්වය ගනු ලැබිණි.

- **චයිනා ඉන්ටර්නැෂනල් ට්‍රැවල් මාර්ට්, කුන්මින්ග් 2011 නොවැම්බර් 27 සිට 30 දින දක්වා**

චයිනා නැෂනල් ටුවරිසම් ඇඩ්මිනිස්ට්‍රේෂන් විසින් සංවිධානය කරන ලද වාර්ෂික ජාත්‍යන්තර වෙළඳ දැක්ම චීන සංචාරක කර්මාන්තයේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් යුතුව ෂැන්හායි නිව් එක්ස්පෝ සෙන්ටර්හීදී පැවැත්විණ. මීට 100,000 කට අධික සංචාරකයන් ප්‍රමාණයක්, වෙළඳ ගැණුම් කරුවන් 1000 ක් සහ මාධ්‍යවේදීන් 800 ක් සහභාගී වූහ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකාවෙන් සමාගම් 8 ක් සහභාගී වූහ.

**රුසියාව**

➢ **ඔබික් ලෙෂ - මොස්කව් 2011 සැප්තැම්බර් මස 21 සිට 24 දින දක්වා**

ශ්‍රී ලංකාව මොස්කව් හි පැවැත්වෙන ලක්සරි ලෙෂ හි නිත්‍ය සාමාජිකයෙකි. එහි තිබූ ශ්‍රී ලංකා වෙළඳකුටිය වර්ගමීටර 21,000 ක ප්‍රමාණයකින් යුක්ත විය. මෙකී කුටිය සැරසීම සඳහා භාවිත කළ සැරසිලි ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ තේමා 08 දැක්වීය. එමෙන්ම, ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් 2011 සැප්තැම්බර් මස 17 වන දින රුසියාවේ සිට ශ්‍රී ලංකාව දක්වා සෘජු ගුවන් සේවය ඇරඹීම සහ ඔවුන් ද මෙකී අවස්ථාවට සහභාගීවීම විශේෂත්වයකි. මෙම අවස්ථාවට රටවල් 74 ක් සහභාගී වූ අතර, සම්පූර්ණ ප්‍රදර්ශකයන් සංඛ්‍යාව 1359 ක් විය. (රුසියාවෙන් 647 ක් සහ ජාත්‍යන්තරව 712 ක් )

➢ **MITT 2011 - සංචාර සහ සංචාරක කර්මාන්තය පිළිබඳව ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය - මොස්කව්, 2011 මාර්තු මස 16 සිට 19 දින දක්වා**

පසුගිය වසර 18 තුළ දේශීය සංචාරක කර්මාන්තය සහ පාරිභෝගිකයන් තුළ දැනුවත්භාවය ඇති කිරීමේ ලා MITT ප්‍රදර්ශනය ඵලදායී සහ කාර්යක්ෂම විය. මෙම ප්‍රදර්ශනය මගින් මොස්කව් හි මධ්‍යම ප්‍රදර්ශන මධ්‍යස්ථානය වන එක්ස්පො සෙන්ටර් හි ප්‍රේක්ෂකාගාර අටක් ආවරණය කෙරේ. MITT ප්‍රදර්ශනය සඳහා අමුත්තන් 80,000 ක් සහ මාධ්‍යවේදීන් 475 කට ආසන්න ප්‍රමාණයක් සහභාගී වීම හේතුවෙන්, මෙම ප්‍රදර්ශනයේ පළමු දිනය ප්‍රභූවරුන්ට පමණක් විවෘත වන අතර, මීළඟ දින දෙක ව්‍යාපාර වෘත්තිකයන් හට විවෘත කෙරේ. මෙම ප්‍රදර්ශනයේ අවසාන දිනය මහජනතාව සඳහා විවෘත කෙරේ. MITT 2011 සඳහා වෙළඳ සමාගම් 14 ක් ඇතුළුව රටවල් 189 කින් 3000 කට අධික සමාගම් ප්‍රමාණයක් සහභාගී වූහ.

**ජර්මනිය**

➢ **ITB - බර්ලින් 2011 මාර්තු 9 දින සිට 13 දින දක්වා**

ලෝකයේ ප්‍රමුඛ මෙම වෙළඳ ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශකයන් 11,000 කට අධික සංඛ්‍යාවක් සහභාගී වූහ. මෙම වසර තුළ, රටවල් 188 ක් නියෝජනය කරමින් සමාගම් 11,163 ක ප්‍රමාණයක් සංචාරක කර්මාන්තයේ නවතම නිෂ්පාදන ඉදිරිපත් කළහ. මීට සහභාගී වූ අමුත්තන් සංඛ්‍යාව 170,000 ක් වශයෙන් ( 2010 : 179,351) වශයෙන් අතිශය ධනාත්මක අගයක් පෙන්වූ අතර, මෙකී පිරිසෙන් සියයට 40 කට අධික ප්‍රමාණයක් පිටරටවලින් සහභාගී වූවන් වූහ. එමෙන්ම මීට රටවල් 94 ක් නියෝජනය කරමින් ජනමාධ්‍යවේදීන් 7000 ක් ඇතුළත් කර ගන්නා ලදී. එමෙන්ම, මීට ශ්‍රී ලංකා සංචාරක පාර්ශ්වකරුවන් රැසක් සංචාර මෙහෙයවන්නන් සහ හෝටල් ඇතුළුව, සම - ප්‍රදර්ශකයන් 57 දෙනෙකු සමග සහභාගී වූහ.

➢ **CMT - Stuttgart, 2011 ජනවාරි 15 දින සිට 23 දින දක්වා**

මෙය ජර්මනියේ පැවැත්වෙන විශාලතම පාරිභෝගික දැක්ම වන අතර, ඊට සහභාගී වූ පිරිස 223,000 ක් ඉක්මවයි, ( වෙළඳ, මාධ්‍ය සහ මහජනතාව). CMT 2011 ප්‍රදර්ශනයට ශ්‍රී ලාංකීය වෙළඳ සමාගම් 4 ක් සහභාගී වූහ.

**ප්‍රංශය**

➢ **Destination Nature - සංචාර සහ සංචාරක කර්මාන්තය පිළිබඳව ප්‍රදර්ශනය - පැරිසිය 2010 මාර්තු 25 සිට 27 දක්වා**

ශ්‍රී ලංකාව ස්වභාවික සෞන්දර්යයයෙන්, වනජීවීන් ගෙන් සමන්විත සහ වික්‍රමාන්විත අත්දැකීමෙන් පිරිපුන්, ගමනාන්තයක් වශයෙන් ප්‍රංශ සංචාරකයන් අතර ජනප්‍රිය කරවීම මෙහි අරමුණ විය. මෙහිදී, ස්වභාවික සෞන්දර්යය මත පදනම් වූ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පාරිභෝගික ප්‍රදර්ශනයක් පැවැත්විණි. මීට ශ්‍රී ලංකාවෙන් සමාගම් 3 ක් සහභාගී වූහ.

➢ **IFTM Trade Fair - පැරිසිය 2011 සැප්තැම්බර් 20 සිට 27 දක්වා**

IFTM 2011 පැවැත්වූයේ ප්‍රංශ සහ ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයේ ප්‍රමුඛ හමුවීම් මධ්‍යස්ථානයක්, වෙළඳ මධ්‍යස්ථානයක් සහ ප්‍රබල බලමුළුවක් වන පෝටේ ඩී වර්සේල්ස්හිදීය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මෙකී අවස්ථාවට වෙළඳ සමාගම් 12 ක් සමග සහභාගී විය.

**ඇමෙරිකා එක්සත් ජනපදය**

➢ **New York Times Travel Show- 2011 පෙබරවාරි 25 සිට 27 දක්වා**

ප්‍රදර්ශකයන් 500 ක් සමග රටවල් 150 ක් මීට සහභාගී වූ අතර, ශ්‍රී ලංකාවෙන් සමාගම් 2 ක් මීට සහභාගී වූහ.

**ජපානය**

➢ **JATA World Travel Fair- තෝකියෝ, 2011 සැප්තැම්බර් 30 දින සිට ඔක්තෝබර් 02 දින දක්වා**

JATA World Travel Fair හි ශ්‍රී ලංකා ප්‍රවර්ධන කටයුතු ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය සහ ශ්‍රී ලංකන් ගුවන් සේවය එකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබීය. මීට රටවල් 139 ක් නියෝජනය කරමින් අමුත්තන් 112,000 ක් සහභාගී වූහ. ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකාගාරය සඳහා සංචාරක සමාගම් 13 ක් සහභාගී වූ අතර, ඔවුන් ශ්‍රී ලංකාව පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමට කටයුතු කළහ.

**ඔස්ට්‍රියාව**

➢ **Ferien- වියානා, 2011 ජනවාරි 13 දින සිට 16 දින දක්වා**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකාවේ ඔස්ට්‍රියා තානාපති කාර්යාලයත් සමග මධ්‍යම යුරෝපයේ වාර්ෂිකව පැවැත්වෙන විශාලතම සංචාර සහ සංචාරක ප්‍රදර්ශනයක් වන "Ferien-Messe 2011" ප්‍රදර්ශනයට දෙවැනි වරට ද සහභාගී විය. මෙම ප්‍රදර්ශනයට රටවල් 70 කට අධික ප්‍රමාණයකින් අමුත්තන් 150,000 කට අධික ප්‍රමාණයක් සහ සංචාර සහ සංචාරක කර්මාන්තයේ සමාගම් 800-850 ත් අතර ප්‍රමාණයක් සහභාගී වූහ. මෙම ප්‍රදර්ශනය පැවැත්වූ දින 04 තුළ, ශ්‍රී ලංකා වෙළඳ කුටිය වෙත, පැමිණි දේශීය සහ සංචාරක කර්මාන්තයේ නියැලෙන අමුත්තන් සංඛ්‍යාව 15,000 ඉක්මවිය.

**ස්වීඩනය**

- **TUR 2010- ගොතෙන්බර්ග්, 2011 මාර්තු 24 දින සිට 27 දින දක්වා**

TUR 2010 යනු ස්කැන්ඩිනේවියානු කලාපය ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රධානතම ප්‍රදර්ශනයයි. ඒ සඳහා අමුත්තන් 50,000 ක් සහ වෙළඳ සාමාජිකයන් 19,000 ක් සහභාගී වූහ. එමෙන්ම, මීට ශ්‍රී ලාංකීය සමාගම් 8 ක් සහභාගී වූහ.

**නෙදර්ලන්තය**

- **Vankantiebeu- සංචාර සහ සංචාරක ප්‍රදර්ශනය, ජනවාරි 11 දින සිට 16 දින දක්වා**

අමුත්තන් 120,000 ක් අතර ශ්‍රී ලංකාව පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම මෙහිදී සිදු කරන ලදී. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලාංකික සමාගම් 10 ක් සහභාගී වූහ.

**එක්සත් අරාබි එමීර් රාජ්‍යය**

- **Arabian Travel Mart ( ATM) - ඩුබායි - 2011 මැයි 02 දින සිට 05 දින දක්වා**

ඇරබියන් ට්‍රැවල් මාර්ට් යනු මැද පෙරදිග සහ පෘන් අරාබි කලාපයේ ව්‍යපාර අවස්ථා ගවේෂණය කිරීම අරමුණු කොට ගත් ප්‍රධාන සංචාර සහ සංචාරක ප්‍රදර්ශනයයි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මෙම අවස්ථාවට 2003 වසරේ සිට සංචාර සහ සංචාරක කර්මාන්තයේ නියැලෙන සමාගම් 33 ක් සමග සහභාගී වූ අතර, මෙම වසරේදී එය ඊට සහභාගී වූයේ සාර්ථක 9 වන අවස්ථාවටය.

**ඉතාලිය**

- **"Borsa Internatinale Tourisme"- සංචාර සහ සංචාරක ප්‍රදර්ශනය - මිලාන්, ඉතාලිය, පෙබරවාරි 17 දින සිට 20 දින දක්වා**

BIT (Borsa Internatinale Tourisme) ඉතාලි සංචාරක කර්මාන්තයේ විශාලතම සංචාරක උත්සවය වන අතර, මීට රටවල් 120 කට වැඩි සංඛ්‍යාවකින් අග්‍රගණ්‍ය නිෂ්පාදන එකතුවක් ඇතුළත් වේ. වෘත්තිකයන් 108,000 කට වඩා වැඩි ප්‍රමාණයක් සහභාගී වූ ඉතාලියේ විශාලතම සංචාරක දැක්ම වූ මේ සඳහා ශ්‍රී ලාංකික සමාගම් 13 ක් සහභාගී වූහ.

**බංග්ලාදේශය**

- **Bangladesh International Tourism Fair (BITF) - ඪකා, බංග්ලාදේශය, 2011 ඔක්තෝබර් 20 දින සිට 22 දින දක්වා**

BITF යනු බංග්ලාද්ශ වෙළඳපොළට ප්‍රවේශයක් ලබා ගැනීම අරබයා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් දේශීය සංචාරක සමාගම් 5 ක් සහ එක්ව සහභාගී වූ විශාලතම සහ ප්‍රධානතම

සංචාරක ප්‍රදර්ශනයයි. BITF විසින් සංචාරක කර්මාන්තයට අදාළ සියලු නිෂ්පාදන සහ අමුත්තන්ට සපයන සේවා සඳහා එක් ස්ථානීය ප්‍රවේශයක් ලබා දෙන අතර, ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන්ට හට හමුවීමේ අවස්ථාවක් ද ලබාදේ. මෙය ඔවුන්හට සහයෝගීතාවය ගොඩනංවාගැනීම සඳහා සංගම් නායකයින්, රජයේ නිලධාරීන් සහ පුද්ගලික අංශයේ නිලධාරීන් ද හමුවීමට අවස්ථාවකි.

**පෝලන්තය**

➢ **Tour Salon - පොන්සැන්, පෝලන්තය 2011 ඔක්තෝබර් 19 දින සිට 22 දින දක්වා**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් දේශීය සමාගම් 6 ක් සමග එක්ව ප්‍රථම වරට Tour Salon- 2011 නියෝජනය කරනු ලැබීය. මෙම ප්‍රදර්ශනයට රටවල් 40 ක් නියෝජනය කරමින් ප්‍රදර්ශකයන් 760 ක් සහ 30000 කට අධික නරඹන්නන් පිරිසක් සහභාගි වූහ. මෙම ප්‍රදර්ශනයේ ස්ථාපනය කෙරුණු ශ්‍රී ලාංකික වෙළඳ කුටිය විවෘත කරනු ලැබූයේ පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපතිනිය වන පැමිලා.ජේ. ඩීන් විසිනි.

**වෙළඳ ප්‍රදර්ශනවල විශේෂ අවස්ථා-**

- 2011 බංග්ලාදේශ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයේ දී ' ප්‍රදර්ශකයාට හිමි රන් සම්මානය' දිනා ගැනීම
- WTM 2011 දී ශ්‍රී ලංකාව ලෝකයේ නැගී එන සංචාරක ගමනාන්ත අතරට ඇතුළත් වීම
- ITB 2011 දී අලංකරණය, ඉදිරිපත් කිරීම, දැකුම්කලුභාවය සහ තොරතුරු සැපයීමේ විශිෂ්ටත්වය සඳහා 9 වැනි හොඳම වෙළඳ කුටියට හිමි සම්මානය ලබා ගැනීම.
- ක්‍රියාකාරී සහයෝගය සඳහා "Leisure 2011" හිදි විශේෂ සම්මාන හිමිවීම.








## වැඩසටහන්

### විසිට් ලංකා 2011

විසිට් 2011 වැඩසටහනේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ඉලක්ක කරනු ලැබූයේ '' ආශ්චර්යමත් දින 08 ක් තුළ ආශ්චර්යමත් අත්දැකීම් 08 ක්'' යන තේමාව මත පදනම් වී සංචාරක නිෂ්පාදන වර්ග 08 ක් පිළිබඳවූ තේමාවයි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ලාංඡනයේ දැක්වෙන SRI LANKA යන්නට පහත සඳහන් පරිදි එකිනෙකට වෙනස් වූ නිෂ්පාදන කාණ්ඩයන් සංකේතවත් කෙරේ.

| | | |
|---|---|---|
| වෙරළ තීර | - | නියම වින්දනය |
| ක්‍රීඩා සහ වික්‍රමාන්විත කටයුතු | - | ත්‍රාසය |
| උරුමයන් | - | උරුමය |
| මානසික සහ කායික සුවතාවය | - | ප්‍රීතිය |
| රටේ දැකුම්කලු භාවය | - | ස්වභාවික සෞන්දර්යය |
| වනජීවීන් සහ ස්වාභාව සෞන්දර්යය | - | වනාන්තර |
| ජනතාව සහ සංස්කෘතිය | - | හරය |
| වසර පුරා පැවැත්වෙන උත්සව | - | උත්සව |

විසිට් ලංකා 2011 ප්‍රවර්ධන වැඩසටහන සංවර්ධනය කරනු ලැබූයේ සංචාරක කර්මාන්තයේ නියැලෙන සමාගම් හා එක්වය. රටේ පැවැති යුධ වාතාවරණය අවසන් වීමත් සමග, ශ්‍රී ලංකාවේ සංචාරයක නිරතවීම සංචාරකයන් විසින් සලකන්නේ සුන්දර අත්දැකීමක් ලෙසටය. ඒ හේතුවෙන් 2011 ප්‍රවර්ධන වැඩසටහන තුළ REFRESHINGLY SRI LANKA හෙවත් සුන්දර ශ්‍රී ලංකාව යන්නට අවධාරණය කරන ලද තේමාවක් විය.

මාස 12 වැඩසටහන - ඉලක්කගත කණ්ඩායම - දේශීය ප්‍රජාව, කර්මාන්තය, පාරිභෝගිකයන් සහ මාධ්‍ය

**ජනවාරි - තේමාව '' වෙරළ තීර''**

- **වෙරළ සංරක්ෂණ දිනය - 2011 ජනවාරි 08**

'' වෙරළ සංරක්ෂණ දින'' වැඩසටහන් වෙරළ ගමනාන්ත වන බෙන්තොට, කලුතර, මීගමුව, වාද්දුව සහ ආරුගම්බේ යන වෙරළ ගමනාන්තයන්හි සංවිධානය කරන ලදී. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු. ලක්ෂ්මන් යාපා අබේවර්ධන විසින් ප්‍රධානත්වය දැරූ මෙහි ප්‍රධානතම උත්සවය වාද්දුව ප්‍රදේශයේදී පැවැත්විනි. මෙම අවස්ථාවට, මුහුදු බඩ හෝටල් වල එවකට ලැගුම් ගෙන සිටි සංචාරකයන් සහ මහජනතාව සහභාගී වූහ.

- **කැටමැරන් තරගය - 2011 ජනවාරි 15**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මීගමු හෝටල් හිමියන්ගේ සංගමය හා එක්ව මීගමු වෙරළ තීරයේ කැටමැරන් තරගයක් සංවිධානය කරනු ලැබීය. එදිනම, ''නියම වින්දන'' තේමාවට අනුව ගෝල්ඩ් සෑන්ඩ්ස් හෝටලයේදී ජායාරූප ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

- **වැලිමාලිගා තරගය - 2011 ජනවාරි 23**

වැලිමාලිගා තරගයක් සහ වෙරළ වොලිබෝල් තරගාවලියක් බෙන්තොට වෙරළේ දී පැවැත්විණ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මෙම තරගය ශ්‍රී ලංකා හෝටල් හිමියන්ගේ සංවිධානය හා එක්ව සංවිධානය කරන ලදී. මෙකී අවස්ථාව සඳහා දේශීය සහ විදේශීය සංචාරකයන් රැසක් එක්වූහ.

- **වෙරළ පිළිබඳ සම්මන්ත්‍රණය - 2011 ජනවාරි 28**

වෙරළ පිළිබඳ සම්මන්ත්‍රණය පවත්වනු ලැබූයේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංවිධානය කරනු ලැබූ '' විසිට් ලංකා'' වැඩසටහන යටතේ පළමු වැඩසටහන වශයෙනි. මෙහිදී පර්යේෂකයන් විසින් ලොව අන් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව සතු විවිධත්වයෙන් සහ ආවේණික සුන්දරත්වයෙන් පරිපූර්ණ සමුද්‍ර ජීවී සම්පත පිළිබඳව පෙන්වා දුන්හ. මෙකී අවස්ථාවට විදේශ දූත මණ්ඩල නියෝජිතයන්, සංචාර නියෝජිතායතන සහ හෝටල් හිමියන්, පර්යේෂකයන් සහ සමුද්‍ර ජීවීන් පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සහභාගී වූහ.

## පෙබරවාරි - '' ක්‍රීඩා සහ වික්‍රමාන්විත'' තේමාව

- **ජාත්‍යන්තර ගෝල්ෆ් තරගාවලිය - 2011 පෙබරවාරි 13**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ වික්ටෝරියා ගෝල්ෆ් ඇන්ඩ් කවුන්ට් රිසෝර්ට්ස් එක්ව ජාත්‍යන්තර ගෝල්ෆ් තරගාවලියක් සංවිධානය කරන ලදී. මෙකී අවස්ථාව සඳහා ලොව විවිධ රටවල් නියෝජනය කරමින් සංචාරකයන් 100 කට අධික පිරිසක් සහභාගී වූහ. මීට අමතරව, මෙකී අවස්ථාව සඳහා දේශීය ගෝල්ෆ් ක්‍රීඩකයන් 25ක් සහභාගී වූහ.

- **ජීපී 14 ලෝක රුවල් නැව් තරගාවලිය - 2011 පෙබරවාරි 25**

මීගමු වෙරළේ සුළං රැල්ල සමගින් ජීපී 14 ලෝක රුවල් නැව් තරගාවලිය ආරම්භ විය. මෙම ලෝක කුසලානය ශ්‍රී ලංකාවේ දී පැවැත්වූයේ ප්‍රථම වරට වන අතර, මින් පෙර බොහෝ අවස්ථාවල එය පවත්වා තිබුණේ යුරෝපීය රටවලය.

- **යටත් විජිතවාදී ක්‍රිකට් සහ සාම්ප්‍රදායික අංගම්පොර කලාව පිළිබඳ සම්මන්ත්‍රණය - 2011 පෙබරවාරි 28**

හිටපු ක්‍රිකට් ක්‍රීඩක සහ වත්මන් ක්‍රිකට් විචාරක ටෝනි ග්‍රේග් මහතා විසින් පවත්වන ලද යටත් විජිතවාදී ක්‍රිකට් පිළිබඳ සම්මන්ත්‍රණයක් ශ්‍රී ලංකා හෝටල් කළමනාකරණ ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.

තවද, සාම්ප්‍රදායික අංගම්පොර පිළිබඳව සංදර්ශනයක් මාස්ටර් කලුපහන සහ ඔහුගේ පිරිස විසින් පවත්වන ලදී.

**මාර්තු - MICE තේමාව**

➢ **දකුණු ආසියාව, නැගෙනහිර ආසියාව සහ පැසිෆික් කලාපය සඳහා UNWTO ඒකාබද්ධ හමු - 2011 මාර්තු 24 දින සිට 26 දින දක්වා**

දකුණු ආසියාව, නැගෙනහිර ආසියාව සහ පැසිෆික් කලාපය සඳහා වාර්ෂික හමුව පැවැත්වීමට ලෝක සංචාරක සංවිධානය විසින් ශ්‍රී ලංකාව තෝරාගනු ලැබිණි. ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය විසින් මාර්තු මාසය රැස්වීම් සහ සම්මන්ත්‍රණ සඳහා වෙන්කර තිබීම හේතුවෙන් මෙකී හමුව ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ මාස 12 සඳහා වන තේමා සමග මනාව ගැලපිය.

**අප්‍රේල් - " ජනතාව සහ සංස්කෘතිය තේමාව"**

➢ ශ්‍රී ලංකාවේ විවිධ ජන කොට්ඨාශ සහ විවිධ ප්‍රදේශ මෙන්ම සංස්කෘතීන් අතර ද සහයෝගීතාවය සංකේතවත් කරමින් සහ තමන්හට ආවේණික වූ සංස්කෘතීන් පෙන්වාදීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සංචාරක පාර්ශ්වකරුවන් හා එක්ව මහනුවර, ත්‍රිකුණාමලය සහ බෙන්තොට යන ප්‍රදේශවලදී විශේෂ අලුත් අවුරුදු උත්සව සංවිධානය කෙරිණ.

**මැයි - " උරුමයන්" තේමාව**

➢ මේ දිනවල 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සමරනු පිණිස විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සහ එක්ව මහා පරිමාණ උත්සව සංවිධානය කෙරෙමින් පවතී.

**ජූනි - " මංගල සහ මධුසමය තේමාව"**

බෙන්තොට වෙරළ, වාද්දුව සහ ගල්කිස්ස ප්‍රදේශයන්හි ජූනි මාසය තුළ විදේශ මංගල උත්සව 05 ක් පවත්වන ලදී.

**ජූලි - " මානසික සහ ශාරීරික සුවතාව" තේමාව**

➢ **ආයුර්වේද ප්‍රදර්ශනය - 2011 ජූලි 15 සිට 17 දින දක්වා**

ආයුර්වේද නිෂ්පාදන සහ සේවා සඳහා උපරිම ආවරණය, ප්‍රචාරය සමග විශිෂ්ට වෙළඳ නාමයක් ගොඩනගා ගැනීම සඳහා මෙන්ම විදේශීය සහ දේශීය සේවාලාභීන් සමග සම්බන්ධතා ඇතිකර ගැනීම සඳහා අවස්ථා උදාකරගනු පිණිස මෙම ප්‍රදර්ශනය BMICH හිදී පවත්වන ලදී.

**අගෝස්තු - " උත්සව තේමාව"**

➢ මහනුවර ඇසළ පෙරහැර සඳහා මාධ්‍ය ආවරණය ලබාදීම - 2011 අගෝස්තු මස 6 සිට 13 දක්වා

**සැප්තැම්බර් - " වනාන්තර" තේමාව**

➢ වනජීවීන් පිළිබඳව පොත් පිංච දොරට වැඩුම - 2011 අගෝස්තු 15 වන දින

''වනාන්තර'' තේමාව සැමරීම සඳහා සංවිධිත ප්‍රධානතම ක්‍රියාකාරකම වශයෙන් වනජීවීන් පිළිබඳ පොත් පිංචක් දොරට වැඩුම සැප්තැම්බර් මාසයේදී කොළඹදී පවත්වන ලදී.






**විශේෂ අවස්ථා**

- ශ්‍රී ලංකාවට පැමිණි පළමු සංචාරකයා පිළිගැනීම - 2011 ජනවාරි 01 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේදී
- ශ්‍රී ලංකාවට පැමිණි 750,000 වන සංචාරකයා සහ 800,000 වන සංචාරකයා පිළිගැනීම
- හොට් එයාර් බැලූන් උත්සවය - 2011 මාර්තු 19 සින සිට අප්‍රේල් 2 දින දක්වා

  ප්‍රධාන උත්සවය නිදහස් චතුරස්‍රයේදී පැවැත්විණ.
  (විදේශිකයන් 10 ක් සහභාගී වූහ)

- විශේෂ බෝධි පූජාව - 2011 ජූනි 11 වන දින කැළණිය රජමහා විහාරයේදී

  සුනාමි ව්‍යසනයෙන් මියැදුණු ජපන් ජාතිකයන්ට පින් අනුමෝදන් කිරීම සඳහා

- '' මාර්කටිං ගුරු'' හෙවත් මහාචාර්ය පිලිප් කොට්ලර් පැමිණීම

  වෝටර්ස් එජ් හෝටලයේදී 50 කට වැඩි සංඛ්‍යාවක් සඳහා විශේෂ සම්මන්ත්‍රණයක් පැවැත්වීම.

## දේශීය උත්සව

- ගාලු සාහිත්‍ය උත්සවය- 2011 ජනවාරි

  ජාත්‍යන්තර රචකයන් සහ ගත්කතුවරුන් සහභාගී වූ ගාලු සාහිත්‍ය උත්සවය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් අනුග්‍රාහකත්වය සපයනු ලැබීය.

- දැයට කිරුළ - 2011 පෙබරවාරි

  රටේ නිදහස් උත්සවය සහ සමගාමීව පැවැත්වෙන අධ්‍යාපනික සහ සංවර්ධනය පිළිබඳ වූ ''දැයට කිරුළ'' 2011 පෙබරවාරි 4 වන දින නිදහස් දින සැමරුම් හා සමගාමීව මොනරාගල බුත්තල ප්‍රදේශයේදී පැවැත්විණ.

### ■ ලෝක සංචාරක දිනය- 2011 සැප්තැම්බර් 27

සංචාර සහ සංචාරක කර්මාන්තයට අදාළ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් යුක්තව, ලෝක සංචාරක දිනය සැමරීම සඳහා කොළඹ දී විශේෂ උත්සවයක් සංවිධානය කෙරිණ. මෙහි ප්‍රධාන උත්සවය '' පාරාදීසයට මාර්ගයක්'' යන නමින් කොළඹ බේරේ වැව සංචාරක කලාපයේදී පැවැත්වූ අතර, මීට රජයේ සහ පුද්ගලික ප්‍රධාන ආයතනයන්ගේ ප්‍රධානීන් සමග පාසැල් ළමුන් 2000 ක් සහභාගී වූහ.


නියම වින්දනය, වික්‍රම, උරුමය, ප්‍රීතිය, ස්වභාව සෞන්දර්යය, වනාන්තර, හරය, උත්සව යන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන තේමා ඇතුලුව, නව මුද්දර 10 ක් මෙම උත්සවයේදී නිකුත් කෙරිණ.

### ■ ආරුගම්බේ ප්‍රෝ සර්ෆ් - 2011 අගෝස්තු 30 දින සිට සැප්තැම්බර් 04 දින දක්වා

පසුගිය වසර 6 තුළ ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් අනුග්‍රාහකත්වය සපයනු ලැබූ ප්‍රෝ සර්ෆ් වාර්ෂික වැඩසටහන ලෝකයේ හොඳම කිමිදුම් ගමනාන්ත 10 අතරින් එකක් වශයෙන් ආරුගම්බේ ප්‍රවර්ධනය කිරීම සඳහා වන තරු 06 වැඩසටහන් වලින් එකක් වන අතර, එමගින් සංචාරක ගමනාන්තයක් වශයෙන් ආරුගම්බේ ප්‍රවර්ධනය කිරීමට සහ ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමග ශක්තිමත් ක්‍රියාකාරී සම්බන්ධතා ගොඩනංවා ගැනීම සඳහා උපයෝගී විය.

### ■ මඩකලපු ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය - 2011 ඔක්තෝබර් 07 දින සිට 09 දින දක්වා

මඩකලපු දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද මඩකලපු ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහභාගී විය. මෙය මෙරට ඇති සංචාරක ආකර්ෂණ පෙන්වාදීම සඳහා සහ කර්මාන්තයේ ඇති වෙනත් ආයෝජන අවස්ථා පෙන්වාදීම සඳහා කදිම අවස්ථාවක් විය.








- **ශ්‍රී ලංකාව සහ යුක්රේනය අතර ගුවන් ගමන් ආරම්භය - 2011 ඔක්තෝබර් 23**

  යුක්රේනය සහ ශ්‍රී ලංකාව අතර ප්‍රථම ගුවන් සේවාව සනිටුහන් කරමින් මෙරටට පැමිණි ප්‍රථම ගුවන් යානාව වන '' එයිරෝස්වීට්'' පිළිගැනීම උදෙසා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ '' වෝටර් කැනන්'' හි පියර් ප්‍රදේශයේදී පිළිගැනීමේ නර්තනයක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංවිධානය කරන ලදී.

- **කුළුබඩු උත්සවය - 2011 ඔක්තෝබර් 28 දින සිට 30 දින දක්වා**

  ''ලෝක කුළුබඩු ආහාර උත්සවය'' ග්‍රීන් පාත් හිදී පැවැත්වූ අතර, එමගින් ආහාර ලෝලීන් හට තම මිතුරන් සහ පවුලේ උදවිය සමග ජාත්‍යන්තර ආහාර වට්ටෝරු රැසක් රස විඳීමේ මෙන්ම දැක බලා ගැනීමේත් අවස්ථාවක් උදාවිය. සජීවී සංගීතය, ඉවුම් පිහුම් ප්‍රදර්ශන සහ විශේෂ සංස්කෘතික දර්ශන මෙම උළෙලට සහභාගී වූවන් සඳහා අමතක නොවන අත්දැකීමක් ලබාදීමට සමත්විය.

- **විසිට් කැන්ඩි 2011- 2011 නොවැම්බර් 10 සිට 13 දින දක්වා**

  ව්‍යවසායන් සඳහා නව අවස්ථාවන් ලබාදීම සඳහාත්, දේශීය ප්‍රජාවගේ සහ අමුත්තන්ගේ සමාජීය දිවි පැවැත්ම සඳහා නව ආරක් ලබාදීම සඳහාත් ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ආයතනය සහ මධ්‍යම පළාතේ සංචාරක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ එක්ව '' විසිට් කැන්ඩි'' නම් වන සංචාරක සහ වෙළඳ ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී.

- **ශ්‍රී ලංකා මෝස්තර උළෙල - 2011 නොවැම්බර් 16 සිට 20 දින දක්වා**

  2011 ශ්‍රී ලංකා මෝස්තර උළෙල, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ එක්ව ඇකඩමි ඔෆ් ඩිසයින් විසින් සංවිධානය කරනු ලැබීය. මෙම උළෙල සංවිධානය කරනු ලැබූයේ, ශ්‍රී ලංකා හෝටල් කර්මාන්තය සහ දිවයින පුරා විසිර සිටින අත්කම් සහ කලා කටයුතුවල නිරත වන්නන් අතර නව වෙළඳ සම්බන්ධතා ගොඩ නංවා, එකී අත්කම් සහ කලා කටයුතුවල නිරතවන්නන් නව නිෂ්පාදන සහ උපාංග නිපදවීමට යොමු කරමින්, දේශීය කර්මාන්තකරුවාගේ ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු නිෂ්පාදන යොදා ගැනීම සඳහා ශ්‍රී ලාංකික හෝටල් කර්මාන්තය යොමු කරවීමය.

- **මිහිපුර අභිමානි 2011 - 2011 දෙසැම්බර් 14 සිට 18 දින දක්වා**

  දේශීය සංචාරකයින් අතර දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා මිහිරිගම පැවැත්වූ '' මිහිපුර අභිමානි'' වෙළඳ සහ අධ්‍යාපනික ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහභාගී විය.

## දැන්වීම්කරණය සහ නිෂ්පාදන

**දැන්වීම්කරණය-**

**වැඩසටහන් දින දර්ශන සහ පුවරු**

2011 වර්ෂය '' විසිට් ලංකා 2011'' වර්ෂය යනුවෙන් නම් කරන ලද අතර, වසරේ මාස 12, ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිත තේමා 12 ක් යටතේ බෙදන ලදී. ඒ අනුව, අදාළ මාසය තුළ පැවැත්වෙන වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා කටයුතු යොදනු ලැබිණි. තවද, උනන්දුවක් දක්වන, අදාළ පාර්ශ්වයන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පිළිබඳ දින දර්ශනයක් ට්‍රැවල් ලංකා සඟරාවේ පළකරන ලදී.

**"Come Visit me" ප්‍රචාරණ වැඩ සටහන - ශ්‍රී ලංකාව සඳහා ප්‍රචාරණ මූලිකත්වයක්**

මෙය තම රට ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයක් ලබාගැනීමේ අරමුණින් යුක්තව සංවිධානය කරනු ලැබූවකි. මෙම ප්‍රචාරණ වැඩසටහන, ප්‍රධාන වශයෙන් ඩිජිටල් මාධ්‍ය උපයෝගී කරගනිමින්, සිදුකරන ලද අතර, අන්තර් ජාලය මෙම ප්‍රචාරණ වැඩ සටහනේ ''හමුවීම් ස්ථානය'' විය. ඒ අතර, ප්‍රවර්ධන සිදු කරනු ලැබූයේ ශ්‍රී ලංකා සංචරණ වෙබ් අඩවිය කරා අමුත්තන් යොමු කිරීම මගිනි.

**ශ්‍රී ලංකා සංචරණ ඩිජිටල් දැන්වීම්කරණ වැඩසටහන - බීබීසී, ඩබ්ලිව්.එස්.ජේ සහ ලෝන්ලි ප්ලැනට්**

ශ්‍රී ලංකාව නැමැති වෙළඳ නාමය, එහි නිෂ්පාදන සහ සේවා, එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය, ඉන්දියාව, මැද පෙරදිග, රුසියාව, නැගෙනහිර යුරෝපීය සහ නැගී එන ආසියාතික වෙළඳපොළ තුළ ඉහළ පන්තියේ සංචාරකයන් අතර ජනප්‍රිය කරවීම සඳහා ට්‍රයඩ් ආයතනය විසින් නිර්මාණය කරන ලද දැන්වීම් ( ඊ බැනර්) බීබීසී, ඩබ්ලිව්.එස්.ජේ සහ ලෝන්ලි ප්ලැනට් යන වෙබ් අඩවිවල ප්‍රදර්ශනය කරන ලදී.

**සංචාර අතරතුරදී සහ අනෙකුත් අවස්ථාවලදී පෙන්වීමට නියමිත විනාඩි පහේ වීඩියෝ පටය**

ශ්‍රී ලංකාව සංචාරකයන් හට ලබාදෙන අත්දැකීම් 8 ට(නියම වින්දනය, ත්‍රාසය, උරුමය, ප්‍රීතිය, උත්සව, වනාන්තර, හරය, ස්වභාවික සෞන්දර්යය) බාහිරව ලබා දෙන වෙනස් ආකාරයේ නිෂ්පාදන සහ සේවා දක්වමින් මිනිත්තු 05 ක වීඩියෝ පටයක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් නිෂ්පාදනය කෙරිණි.

**දේශීය සහ විදේශීය දැන්වීම්**

එක්ස්ප්ලෝර් ශ්‍රී ලංකා සහ ට්‍රැවල් ලංකා යන සඟරාවල මෙන්ම, ටීටීජී මෙනා ලක්සරි, ලෝන්ලි ප්ලැනට් සහ බිග් ඉෂු වැනි ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයට සහ සංචරණයන්ට අදාළ සඟරාවන්හි ද දැන්වීම්කරණය මෙන්ම ශ්‍රී ලංකාවට පැමිණි 750,000 සහ 800,000 සංචාරකයා පිළිගැනීම සම්බන්ධයෙන් පුවත්පත් දැන්වීම් පළ කිරීම.











**වෙබ් අඩවිය නවීකරණය කිරීම**





**නිෂ්පාදන-**

තේමා 8 මත පදනම් වූ, විවිධ භාෂා වලින් ලියැවුණු තේමා 8 මත පෝස්ටර් සහ සීඩී තැටි නිර්මාණය කර නිෂ්පාදනය කරන ලදී. මේවා විදේශ සංචාර ප්‍රදර්ශන, ශ්‍රී ලංකාවේ පැවැත්වූ සම්මන්ත්‍රණ, ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම් කාර්යාල මගින් බෙදාහරින ලදී.




දිවියන් දෙදෙනෙකු දැක්වෙන, ශ්‍රී ලංකා සංචරණ ආයතනයේ '' වයිල්ඩ් '' නැමැති ගමනාන්ත ප්‍රවර්ධන පෝස්ටරයට "Prestigious Vettor Giusti award" සම්මානය හිමිවූ අතර, එය එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධාන මහ සමුළුවේදී දකුණු ආසියානු කලාපයෙන් ලද විශිෂ්ටතම පෝස්ටරය වශයෙන් නම් කෙරිණ.



## මහජන සම්බන්ධතා

### 2011 ජාත්‍යන්තර මාධ්‍යවේදීන් පැමිණීමේ වැඩසටහන

2011 මාධ්‍යවේදීන් පැමිණීමේ වැඩසටහන යටතේ, ප්‍රධාන වෙළඳපොළවල වලින් බලපෑමක් ඇතිකළ හැකි මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍යවේදීන් 196 ක් ආකර්ෂණය කරගැනීමට හැකි වූ අතර, ඉන් ජාතියට ලැබුණු ප්‍රචාරණයේ වටිනාකම රුපියල් මිලියන 500.9 කට ආසන්න විය.

| **රට** | **මාධ්‍යවේදීන් සංඛ්‍යාව** | **ජනප්‍රිය තරුව** | **තත්වය** | **සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| ජපානය | 12 | බංග්ලාදේශය | මෝස්තර නිර්මාණ ශිල්පී | 1 |
| එක්සත් රාජධානිය | 6 | ඉන්දියාව | චොන්දේ නාස්ටි- ඉන්දියාව | 1 |
| පිලිපීනය | 9 | ඉන්දියාව - මනීෂා කොයිරාළ | සිනමා නිළි | 1 |
| ඇ.එ.ජ. | 7 | තායිලන්තය | තායිලන්ත රජ කුමරිය | 1 |
| බෙල්ජියම | 2 | නේපාලය | සිනමා නිළි | 1 |
| ක්‍රොඒෂියා | 3 | මියන්මාරය | සිනමා නිළි | 4 |
| ඉතාලිය | 18 | භූතානය | සිනමා නිළි | 3 |
| කොරියාව | 1 | ඉන්දියාව - සොනාක්ෂි සිංහා | සිනමා නිළි | 1 |
| බංග්ලාදේශය | 4 | | | |
| ස්පාඤ්ඤය | 5 | | | |
| කැනඩාව | 21 | | | |
| සිංගප්පූරුව | 12 | | | |
| හොංකොං | 2 | | | |
| ඔස්ට්‍රේලියාව | 4 | | | |
| ප්‍රංශය | 4 | | | |
| නෙදර්ලන්තය | 2 | | | |
| ස්වීඩනය | 2 | | | |
| ඉන්දුනීසියාව | 1 | | | |
| මැලේසියාව | 3 | | | |
| තායිලන්තය | 1 | | | |
| දකුණු අප්‍රිකාව | 1 | | | |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 1 | | | |
| කුවේට් | 4 | | | |
| ඩෙන්මාර්කය | 1 | | | |
| ඔස්ට්‍රියාව | 3 | | | |
| යුක්රේනය | 8 | | | |
| ජර්මනිය | 5 | | | |
| රුසියාව | 11 | | | |
| ඉන්දියාව | 16 | | | |
| චීනය | 14 | | | |
| එකතුව | 183 | | එකතුව | 13 |



- නැෂනල් ජෝග්‍රැෆික් සංචාරක සඟරාව විසින් ශ්‍රී ලංකාව '' 2012 වසරේ ලෝකයේ හොඳම ගමනාන්තය'' ලෙස නම් කරනු ලැබීය.
- කොන්ඩෙ නාස්ට් ට්‍රැවලර් විසින් ශ්‍රී ලංකාව 2012 වසරේ සංචාරය කිරීමට වඩාත්ම හොඳ ගමනාන්ත පහ අතරට ඇතුළත් කරන ලදී.

**මාධ්‍යවේදීන් පැමිණීමේ වැඩසටහන් වලින් ලද මාධ්‍ය වටිනාකම**

| මාධ්‍ය ආයතනය | රට | විද්‍යුත්/ මුද්‍රිත | මාධ්‍ය වටිනාකම | ප්‍රචාරණය ලබා දුන් කාලය | මාධ්‍ය වටිනාකම |
|---|---|---|---|---|---|
| BE- PAL සඟරාව | ජපානය | මුද්‍රිත | ජපන් යෙන් 9,000,000 | 2011 මැයි | 12,856,500 |
| බීබීසී | එක්සත් රාජධානිය | විද්‍යුත් | පවුම් 360,000 | 2011 අගෝස්තු | 63,000,000 |
| මැනිලා ටයිම්ස් | පිලිපීනය | මුද්‍රිත | ඇඩො 14,310 | 2011 අප්‍රේල් 01 | 1,574,100 |
| ට්‍රැවල්ලයිෆ් සඟරාව | පිලිපීනය | මුද්‍රිත | ඇඩො 10,200 | 2011 ජුනි ජූලි | 1,122,000 |
| ද රිපෙලෙනිෂර් | ඇ.එ.ජ. | මුද්‍රිත | ඇඩො 20,000 | 2011 මාර්තු 31 | 2,200,000 |
| DER ස්ටෑන්ඩර්ඩ් රොන්ඩෝ | ජර්මනිය | මුද්‍රිත | යුරෝ 29,800 | 2011 මැයි 13 | 4,601,520 |
| Om සඟරාව | එක්සත් රාජධානිය | මුද්‍රිත | පවුම් 9,000 | 2011 ජූලි | 1,575,000 |
| කුයි ටුවරින් | ඉතාලිය | මුද්‍රිත | යුරෝ 548,43.5 | 2011 සැප්තැම්බර් | 84,459,375 |
| CREA සංචාරක සඟරාව | ජපානය | මුද්‍රිත | ජපන් යෙන් 35,100,000 | 2011 සැප්තැම්බර් | 50,140,350 |
| අවුට්ලුක් සඟරාව | ඉන්දියාව | මුද්‍රිත | ඉන්දීය රුපියල් 6,187,500 | 2011 සැප්තැම්බර් | 14,726,250 |
| වෙල්ත් ටීවී | ඇ.එ.ජ. | විද්‍යුත් | ඇඩො 100,000 | 2011 නොවැම්බර් | 11,000,000 |
| ටොනික් ටීවී | යුක්රේනය | විද්‍යුත් | ඇඩො 95,814 | 2011 මැයි සහ ජූනි | 10,539,540 |
| එච්ටීවී | ක්‍රොඒෂියාව | විද්‍යුත් | 1,194,300 | | 25,772,994 |
| මාකොපෝලෝ ටීවී | ඉතාලිය | විද්‍යුත් | ඇඩො 183,600 | 2011 ඔක්තෝබර් | 20,196,000 |
| පැනරොමා ට්‍රැවල් | ඉතාලිය | මුද්‍රිත | ඇඩො 215,000 | 2012 ජනවාරි | 23,650,000 |
| මාකොපෝලෝ සඟරාව | ඉතාලිය | මුද්‍රිත | ඇඩො 26,600 | 2012 පෙබරවාරි | 2,926,000 |
| මැක්ස් සඟරාව | ඉතාලිය | මුද්‍රිත | ඇඩො 10,000 | 2011 ජූලි | 1,100,000 |
| ලැටිටියුඩ්ස්ලයිෆ් | ඉතාලිය | විද්‍යුත් | ඇඩො 120,000 | 2011 ඔක්තෝබර් | 13,200,000 |
| අයිලන්ඩ්ස් සඟරාව | ඔස්ට්‍රේලියාව | මුද්‍රිත | ඇඩො 238,230 | 2012 මාර්තු | 26,205,300 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ටෙන්ටවුමුෂි සඟරාව | ජපානය | මුද්‍රිත | ජපන් යෙන් 31,500,000 | 2012 පෙබරවාරි | 44,997,750 |
| ක්වයට් ඩිප්ලොමැසි | එ. අරාබි එමීර් | මුද්‍රිත | ඇඩො 4,500 | 2011 නොවැම්බර් | 495,000 |
| ඊස්ට් වීක් සඟරාව | හොංකොං | මුද්‍රිත | ඇඩො 675,000 | 2011 සැප්තැම්බර්07 | 74,250,000 |
| ගල්ෆ් ට්‍රැවලර් | කුවේට් | මුද්‍රිත | ඇඩො 52,500 | 2012 මැයි/ජූනි | 5,775,000 |
| ලොෆීෂියල් | ඉන්දියාව | මුද්‍රිත | ඉන්දීය රුපියල් 1,936,000 | 2012 ජනවාරි | 4,607,680 |
| | | | | | 500,970,359.00 |

**මාධ්‍යවේදීන් පැමිණීමේ වැඩසටහන මගින් ලද ලාභය සහ ඊට වැයවූ මුදල**




## මානව සම්පත්, පරිපාලන සහ මූල්‍ය

| **කාර්යමණ්ඩලය** | **සේවකයන් සංඛ්‍යාව** | |
|---|---|---|
| 2010 ජනවාරි 1 වන විට | 36 | |
| එකතුකළා: නව බඳවා ගැනීම් | 18 | 54 |
| අඩුකළා: විශ්‍රාම ලැබූ/ ඉල්ලා අස්වූ | 05 | |
| 2010 දෙසැම්බර් මස අවසානයේදී | 49 | |

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව, වැටුප් ව්‍යුහය සහ පුරප්පාඩු**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 30 දරන චක්‍රලේඛය ප්‍රකාරව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ කාර්යමණ්ඩලය අනුමත නව සේවක සංඛ්‍යාව සඳහා අන්තර්ග්‍රහණය කර ඇති අතර, එකී චක්‍රලේඛයේ 30 (1) ප්‍රකාරව නව වැටුප් ව්‍යුහය ක්‍රියාත්මක කර ඇත. පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් පුවත්පත් දැන්වීමක් පළකරන ලද අතර, ඒ අනුව 2010 සැප්තැම්බර් මාසයේදී සම්මුඛ පරීක්ෂණ පවත්වා 2010 දෙසැම්බර් මාසයේදී පත්වීම් දෙන ලදී.

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය**
**2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශනය**

| | සටහන | 2011 රුපියල් | 2010 රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමාන | 3 | 819,853,581.02 | 177,457,518.50 |
| ලැබිය යුතු | 4 | 340,609,153.97 | 370,394,051.10 |
| අත්තිකාරම් | 5 | 3,403,093.20 | 2,028,170.42 |
| පෙරගෙවීම් | 6 | 231,123.85 | 1,540,259.37 |
| ණය හිමියෝ | 7 | 34,067,741.85 | 33,151,568.90 |
| භාණ්ඩ ලැයිස්තු | | 6,996,488.20 | 3,524,419.21 |
| | | 1,205,161,182.09 | 588,095,987.50 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, යන්ත්‍ර සහ උපකරණ | 8 | 15,485,923.32 | 18,051,625.75 |
| | | 15,485,923.32 | 18,051,625.75 |
| **සමස්ත වත්කම්** | | **1,220,647,105.41** | **606,147,613.25** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| පූර්ව ආදායම් | 9 | 5,585,302.75 | 7,417,059.71 |
| ගෙවීමට ඇති තැන්පතු | 10 | 552,667.74 | 978,067.08 |
| සේවක ප්‍රතිලාභ | 11 | 5,996,352.63 | 5,004,637.50 |
| උපචිත වියදම් | | 223,272,965.65 | 38,867,992.79 |
| ණය හිමියෝ | 12 | 25,388,355.74 | 185,773,300.00 |
| | | 260,795,644.51 | 238,041,057.08 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දිගු කාලීන ණය | | - | 66,666,666.68 |
| | | - | 66,666,666.68 |
| **සමස්ත වගකීම්** | | **260,795,644.51** | **304,707,723.76** |
| **මුළු වත්කම්** | | **959,851,460.90** | **301,439,889.49** |
| **ශුද්ධ වත්කම්/ව්‍යාපාර ස්කන්ධය** | | | |
| ප්‍රාග්ධන දායකත්වය | | 33,069,156.52 | 33,069,156.52 |
| උපචිත අතිරික්ත/හිඟතා | | 926,782,304.38 | 268,370,732.97 |
| **සමස්ත ශුද්ධ වත්කම්/ව්‍යාපාර ස්කන්ධය** | | **959,851,460.90** | **301,439,889.49** |

එච්.සී.ජේ ගුණවර්ධන
සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

ආචාර්ය. නාලක ගොඩහේවා
සභාපති
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය**
**2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| | සටහන | 2011<br>රුපියල් | 2010<br>රුපියල් |
|---|---|---|---|
| **ආදායම** | | | |
| නාවාරෝහණ අධිභාරය | | 729,174,937.13 | 671,396,446.08 |
| සංචාරක සංවර්ධන අධිභාරය | | 454,839,489.53 | 359,274,986.21 |
| වෙනත් ආදායම් | 13 | 64,244,678.25 | 79,459,590.72 |
| **සමස්ත ආදායම** | | **1,248,259,104.91** | **1,110,131,023.01** |
| **වියදම්** | | | |
| වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 14 | 26,121,005.89 | 22,421,278.46 |
| භාවිත කළ සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ | 15 | 31,537,697.61 | 34,704,463.45 |
| වෙළඳාමට අදාළ පිරිවැය - විදේශීය | 16 | 30,805,777.48 | 29,910,841.62 |
| වෙළඳාමට අදාළ පිරිවැය - දේශීය | 17 | 477,546,792.44 | 949,770,040.43 |
| ක්ෂය වීම් සහ ක්‍රමක්ෂ පිරිවැය | | 3,978,586.48 | 6,207,438.03 |
| වෙනත් පිරිවැය | 18 | 14,612,648.09 | 47,618,967.21 |
| මූල්‍ය පිරිවැය | 19 | 5,245,025.51 | 7,217,523.64 |
| **සමස්ත පිරිවැය** | | **589,847,533.50** | **1,097,850,552.84** |
| අදාළ කාලය සඳහා අතිරික්තය/(හිඟය) | | 658,411,571.41 | 12,280,470.17 |
| ඉදිරියට ගෙන ආ අතිරික්තය/(හිඟය) | | 268,370,732.97 | 256,090,262.80 |
| ඉදිරියට ගෙන ආ අතිරික්තය/(හිඟය) | | **926,782,304.38** | **268,370,732.97** |

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය**
**2011 දෙසැම්බර් සහ 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**සමස්ත වත්කම්/ ව්‍යාපාර ස්කන්ධයන් ප්‍රකාශනය**

| | දායක වූ ප්‍රාග්ධනය | උපචිත අතිරික්ත / (හිඟය) | මුළු ගණන |
|---|---|---|---|
| | රුපියල් | රුපියල් | රුපියල් |
| 2010 ජනවාරි 01 දිනට ශේෂය | 33,069,156.52 | 256,090,262.80 | 289,159,419.32 |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / ( හිඟය) | - | 14,620,733.55 | 14,620,733.55 |
| නැවත ප්‍රකාශනය | | (2,340,263.38) | (2,340,263.38) |
| 2010 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රකාශිත ශේෂය | 33,069,156.52 | 268,370,732.97 | 301,439,889.49 |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / ( හිඟය) | - | 658,411,571.41 | 658,411,571.41 |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 33,069,156.52 | 926,782,304.38 | 959,851,460.90 |

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය**
**2011 දෙසැම්බර් සහ 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

| | **2011** |
|---|---|
| | රුපියල් |
| **මෙහෙයුම් කාර්යයන් හේතුවෙන් සිදුවූ මූල්‍ය ප්‍රවාහ** | |
| අතිරික්තය/ (හිඟය) | 658,411,571.41 |
| **මුදල් නොවන කාර්යයන්** | |
| ක්ෂයවීම | 3,978,586.48 |
| කාර්යමණ්ඩල ණය පොළිය | (68,503.38) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 991,715.13 |
| හුවමාරු ලාභ/අලාභ | 42,924.00 |
| පාඩු සහ කපාහැරීම් | 108,737.97 |
| අයවිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම | 29,784,897.13 |
| අත්තිකාරම් (වැඩිවීම)/ අඩුවීම | (1,374,922.78) |
| පෙරගෙවුම් (වැඩිවීම)/ අඩුවීම | 1,309,135.52 |
| ණය හිමියෝ (වැඩිවීම)/ අඩුවීම | (916,172.95) |
| භාණ්ඩ ලැයිස්තු (වැඩිවීම)/ අඩුවීම | (3,472,068.99) |
| ලද ආදායම් (වැඩිවීම)/ අඩුවීම | (1,831,756.96) |
| ගෙවිය යුතු තැන්පතු (වැඩිවීම)/ අඩුවීම | (425,399.34) |
| උපචිත පිරිවැය (වැඩිවීම)/ අඩුවීම | 184,404,972.86 |
| ණය හිමියෝ (වැඩිවීම)/ අඩුවීම | (160,384,944.26) |
| කාර්යමණ්ඩල ණය පොළිය | 68,503.38 |
| **මෙහෙයුම් කාර්යයන් හේතුවෙන් සිදුවූ සමස්ත මූල්‍ය ප්‍රවාහය** | **710,616,511.20** |
| **ආයෝජන කාර්යයන් ගෙන් සිදිවූ මූල්‍ය ප්‍රවාහය** | |
| දේපළ යන්ත්‍ර සහ උපකරණ මිලට ගැනීම | (1,553,782.00) |
| **ආයෝජන කාර්යයන් ගෙන් සිදුවූ මූල්‍ය ප්‍රවාහය** | **(1,553,782.00)** |
| **මූල්‍ය කාර්යයන්ගෙන් සිදුවූ මූල්‍ය ප්‍රවාහය** | |
| ණය පියවීම | (66,666,666.68) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් සිදුවූ මූල්‍ය ප්‍රවාහය** | **(66,666,666.68)** |
| **මුදල් සහ මුදල් සමානවල (වැඩිවීම)/ අඩුවීම** | **642,396,062.52** |
| **කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන** | **177,457,518.50** |
| **කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් සමාන** | **819,853,581.02** |

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය**

**2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සත්‍ය ආදායම් වියදම් සහ අයවැය ප්‍රකාශනය**

| ගිණුම් කේතය | විස්තරය | 2011 | | |
|---|---|---|---|---|
| | | සත්‍ය | අයවැය | විචලනය |
| | | රුපියල් | රුපියල් | රුපියල් |
| | **ආදායම** | | | |
| **6000** | සංචාරක සංවර්ධන අධිභාරය | 454,839,490 | 437,520,000 | 3.96 |
| **6001** | නාවාරෝහණ අධිභාරය | 729,174,937 | 814,800,000 | (10.51) |
| **6100** | වෙළඳ දායකත්වය සහ අනෙකුත් ආදායම් | 64,244,678 | 90,000,000 | (28.62) |
| | **සමස්ත ආදායම** | **1,248,259,104** | **1,342,320,000** | **(7.01)** |
| | | | | |
| | | | | |
| | **වියදම්** | | | |
| | **1.0 අලෙවිකරණ සන්නිවේදනය** | **129,260,796** | **407,872,000** | 68.31 |
| **7534** | 1.1 මාධ්‍ය | | | |
| 7534a | අ.දේශීය | 6,100,226 | 4,900,000 | -24.49 |
| 7534b | ආ. විදේශීය | 196,999 | 13,000,000 | 98.48 |
| 7534c | ඇ. මාධ්‍යවේදීන් පැමිණීමේ වැඩසටහන සහ වෙළඳ සහ FAM සංචාර | 22,921,596 | 20,000,000 | -14.61 |
| 7534d | ඈ. රඳවාගැනීම් ගාස්තු | - | 70,000,000 | 100.00 |
| 7534e | ඉ. ජනප්‍රියතරු යොදාගනිමින් කළ ප්‍රචාරණ | 3,995,909 | 5,100,000 | 21.65 |
| **7521** | 1.2 ප්‍රචාරණය | | | |
| 7521C | අ. කළමනාකරණ ගාස්තු සහ සැරසිලි | 5,464,671 | 40,000,000 | 86.34 |
| 7521A | ආ. මාධ්‍ය ප්‍රචාර සහ දැනුවත් කිරීම් | 48,246,816 | 126,750,000 | 61.94 |
| **7532** | 1.3 ද්‍රව්‍ය නිර්මාණය සහ නිෂ්පාදනය | 41,092,396 | 89,665,000 | 54.17 |
| **7650** | 1.4 වෙබ් සහ සෘජු අලෙවිකරණය | 1,242,182 | 38,457,000 | 96.77 |
| | | | | |

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය**

**2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සත්‍ය ආදායම් වියදම් සහ අයවැය ප්‍රකාශනය**

| ගිණුම් කේතය | විස්තරය | 2011 | | |
|---|---|---|---|---|
| | | සත්‍ය | අයවැය | Variance |
| | | රුපියල් | රුපියල් | රුපියල් |
| **7512** | **2.0 අලෙවිකරණ ප්‍රවර්ධන** | **296,128,999** | **497,945,000** | 40.53 |
| **7515** | භූගෝලීය | | | |
| **7595** | නිෂ්පාදන | 296,128,999 | 497,945,000 | 40.53 |
| **7680/7682** | දූත මණ්ඩල සහ ඩයස්පෝරාව | | | |
| | | | | |
| **7620** | **3.0 පර්යේෂණ** | 1,274,931 | **18,350,000** | 93.05 |
| 7620a | ▪ 3.1 සංචාරකයන් පිළිබඳ සමීක්ෂණ | 5,625 | 2,650,000 | 99.79 |
| 7620b | ▪ 3.2 වෙළඳපළ බුද්ධි අධ්‍යයන | 1,269,306 | 15,700,000 | 91.92 |
| | | | | |
| **7570** | **4.0 වැඩසටහන්** | **50,755,537** | **91,275,000** | 44.39 |
| **7520** | 4.1 දේශීය | 50,755,537 | 81,275,000 | 37.55 |
| | 4.2 ජාත්‍යන්තර | - | 10,000,000 | |
| | | | | |
| | **5.0 පාරිභෝගික සේවා** | 7,230,862 | **61,000,000** | 88.15 |
| **7689** | අමුත්තන් හට පහසුකම් සම්පාදනය සහ ආකර්ෂණීයභාවය සංවර්ධනය කිරීම | 7,230,862 | 61,000,000 | 88.15 |
| | | | | |
| | **6.0 විශේෂ ව්‍යාපෘති** | **23,701,445** | **31,000,000** | 23.54 |
| **7541** | විසිට් ශ්‍රී ලංකා 2011 | 23,701,445 | 31,000,000 | 23.54 |
| | | | | |
| | **7.0 දේශීය පරිපාලනය** | **70,051,331** | **99,400,000** | **29.53** |
| **7695** | **එකතු කරන ලද අගය මත බදු** | **11,443,633** | **-** | **-** |
| | **සමස්ත පිරිවැය** | **589,847,534** | **1,206,842,000** | **51.12** |
| | | | | |
| **2380** | **8.0 IIFA ණය** | 66,666,667 | 55,000,000 | (21.21) |
| | **9.0 ප්‍රාග්ධන පිරිවැය** | 1,553,982 | 80,478,000 | 98.07 |
| | **10.0 උපචිත පිරිවැය** | 38,837,172 | - | - |
| | **සමස්ත පිරිවැය** | **696,905,354** | **1,342,320,000** | **48.08** |

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. වාර්තාකරණ ආයතනය

### 1.1 සංස්ථාපනය

2007 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2005 අංක 38 දරන සංචාරක පනත ක්‍රියාත්මක කරනු ලැබිණි. 2007 ඔක්තෝබර් මස 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි, නව ආයතන පහත සඳහන් පරිදි සංස්ථාපනය කර ඇත.

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
- ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

### 1.2 සංචාරක සංවර්ධන අරමුදල බෙදාහැරීම

සංචාරක පනතේ 23 (1) වගන්තිය ප්‍රකාරව, සංචාරක සංවර්ධන අරමුදල ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය සහ අලෙවිකරණය කිරීම සඳහා යොදාගත හැක. මෙම අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියයි.

සංචාරක පනතේ 24 (8) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් ප්‍රතිශතවලින් අරමුදල බෙදාහරිනු ලබයි.

| දේශීය අධිකාරිය | ලබාදෙන ප්‍රතිශතය |
|---|---|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 14% |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 70% |
| ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය | 12% |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 4% |

### 1.3 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ලක්ෂණ

ශ්‍රී ලංකාව, එහි වූ සුන්දර වෙරළ තීර, උණුසුම් සහ සුහදශීලී ජනතාව සහ එය සතු අග්‍රගණ්‍ය ස්වාභාවික. සංස්කෘතික සහ වික්‍රමාන්විත අත්දැකීම් සමග, ආසියාවේ සංචාරක සන්ධිස්ථානය බවට පත්කර එය සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් සඳහා මෙන්ම ශ්‍රී ලංකාවාසී ජනතාවට ද ප්‍රතිලාභ ලබා දෙන විශාලතම විදේශ විනිමය උපයන්නා වශයෙන් සංවර්ධනය කර, ශ්‍රී ලංකාව ආසියාවේ ප්‍රමුඛතම සහ ඉතාමත් හරිත දිවයින වශයෙන් ස්ථාපනය කොට ස්ථානගත කිරීම.

## 1.4 සේවකයන් සංඛ්‍යාව

මෙම කාලපරිච්ඡේදය සඳහා සේවක සංඛ්‍යාවේ සාමාන්‍යය 49 කි.

## සැකසීමේ මූලාශ්‍රය

## 1.5 අනුකූලතා ප්‍රකාශය

අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්වලින් සමන්විත ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්වය ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය යන මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් 2009 ඉදිරිපත් කරන ලද රාජ්‍ය අංශ ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන සැකසුම් ක්‍රමය

මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත්තේ සම්ප්‍රදායික වියදම් සම්මුතීන්ට අනුකූලවය

## 1.7 ඉදිරිපත් කරන මුදල් ඒකකය

ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් සියලු මූල්‍ය ප්‍රකාශන සකසා ඇත.

## 1.8 ඇස්තමේන්තු සහ තීරණ යොදා ගැනීම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති මූල්‍ය ප්‍රකාශන හේතුවෙන්, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වලට අදාළ වන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන ගැනීමට කළමනාකාරීත්වයට සිදුවේ. සත්‍ය ප්‍රතිඵල මෙකී ඇස්තමේන්තුවට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ මූලික උපකල්පන නිත්‍ය පදනමින් අගයනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන කාලයේදී, එකී කාලයට සහ ඉන් බලපෑම් විය හැකි ඉදිරි කාලය සඳහා වන ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන හඳුනාගැනේ.

මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් මිල ගණන් සම්බන්ධයෙන් වඩාත් බලපෑම් ඇතිවිය හැකි ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී තීරණාත්මක කරුණු පිළිබඳව තොරතුරු සහ ඉදිරියේදී ද්‍රව්‍යමය ගැලපීම් සම්බන්ධයෙන් සැලකිය යුතු තීරණ සහිත අවිනිශ්චිත ඇස්තමේන්තු අදාළ සටහන්වල ඇතුළත් කර ඇත.

## 1.9 මූල්‍ය ප්‍රකාශන කළමනාකාරීත්වය සම්බන්ධයෙන් වගකීම් දැරීම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙකී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ සාධාරණව ඉදිරිපත් කිරීමේ වගකීම කළමණාකාරීත්වය විසින් දරනු ලබයි. මෙකී වගකීමට, වංචනිකභාවය හෝ වැරදීම් හේතුවෙන් වැරදි ලෙස ප්‍රකාශ නොවන මූල්‍ය ප්‍රකාශන සැකසීමේ සහ සාධාරණව ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම, සුදුසු ගණකාධිකරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ ක්‍රියාත්මක කිරීම සහ අවස්ථානුකූලව සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීම අයත්වේ.

**1.10 ගෙවුම් ශේෂ පත්‍ර දිනට පසු පැවැත්වූ වැඩසටහන්**

ගෙවුම් ශේෂ පත්‍ර දිනට පසු පැවැත්වූ සියලු වැඩසටහන් සලකාබලා, මූල්‍ය ප්‍රකාශනයේ සුදුසු ස්ථානයන්හි අවශ්‍ය පරිදි ගැලපුම්/ අනාවරණය කිරීම් සකස් කර ඇත.

2011 වර්ෂය තුළදී, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින්, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සහ මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ බදු උපදේශක සහ එක්ව නැවත ගෙවනු ලබන එකතු කරන ලද අගය මත බදු පිළිබඳ කටයුතු අවසන් කර ගැනීමේ කාර්යයෙහි නිරත විය. 2011 වර්ෂය තුළ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය බදු අයකර ගැනීමට අදාළ කාර්යයක නියැලී නොමැති බව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලදුව, ඒ හේතුවෙන් එකතු කරන ලද අගය මත බදු නැවත ලබා ගැනීම සඳහා හිමිකම් නොලබන බව අවසාන තීරණය විය. 2011.12.21 දින ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් එවන ලද ලිඛිත දැන්වීම ලැබුණු අතර එකී ප්‍රකාශනයෙහි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය බදු අයකරගැනීමට අදාළ කාර්යයක නියැලී නොතිබීම හේතුවෙන් එකතු කරන ලද අගය මත බදු නැවත ලබා ගැනීමට හිමිකම් නොලබන බව සඳහන් විය.

ඒ අනුව, එකතු කරන ලද අගය මත බදු නැවත ගෙවනු ලැබීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හිමිකම් නොලබන බැවින්, මූල්‍ය ප්‍රකාශනයේ එකතු කරන ලද අගය මත බදු නැවත ගෙවනු ලැබීම යටතේ ගැලපීමක් එක් කර ඇත.

**2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1 භාණ්ඩ ලැයිස්තු**

භාණ්ඩ තොග, පිරිවැය මත හෝ ඒවා විකුණා ලබාගත හැකි මුදල යන මින් කවර හෝ අඩු අගය මත තක්සේරු කරනු ලැබේ.

**2.2 ක්ෂය වීම**

ක්ෂයවීම සඳහා වන පිරිවැය, පිරිවැය මත හෝ සියලු දේපළ තක්සේරුකරණය මත පදනම්ව, අත්කරගනු ලැබූ දිනයේ සිට ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලය තුළ එකී පිරිවැය/තක්සේරුව කපාහැරීම සඳහා සෘජු රේඛා පදනමින් ගණනය කරනු ලැබේ.

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 7.5% |
| පරිගණක සහ උපාංග | 25% |
| රථවාහන | 25% |
| වායු සමීකරණ | 7.5% |
| කාර්යාලීය උපකරණ | 7.5% |
| දුරකථන | 7.5% |
| විවිධ උපකරණ | 7.5% |
| මෘදුකාංග | 7.5% |
| ගොඩනැගිලි වැඩිදියුණු කිරීම | 10% |

**2.3 දේපළ, යන්ත්‍ර සහ උපකරණ**

දේපළ, යන්ත්‍ර සහ උපකරණ යන අයිතම උපචිත ක්ෂයවීම් සහ උපචිත හානි /පාඩු වලට වඩා අඩු පිරිවැයකට ගණනය කර ඇත. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගොඩනැගිල්ල අයත් වන්නේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියටය.

**2.4 විදේශ මුදල් ගනුදෙනු**

මෙම ගනුදෙනු පහත සඳහන් ගාස්තු මත පරිවර්තනය කර ඇත.

- ලැබීම් සහ ගෙවීම් - සත්‍ය ගාස්තු
- ජංගම වත්කම් සහ වගකීම් - ආවෘති ගාස්තු

**2.5 අදාළ පාර්ශ්වයන් සමග ගනුදෙනු**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්හි 24 වගන්තියට අදාළව, හෙළිදරව් කිරීම සඳහා අදාළ පාර්ශ්වයන් සමග ගනුදෙනු දැක්විය නොහැක.

**2.6 පාරිතෝෂික සඳහා විධිවිධාන**

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එක් වසරක සේවා කාලයක් අවසන් කළ සියලු සේවකයන් සඳහා පාරිතෝෂික ගෙවීම සඳහා පූර්ණ ප්‍රතිපාදන සැපයීම ආයතනය විසින් සිදුකෙරේ.

**2.7 උපචිත පිරිවැය**

ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පිරිවැය යන්නට ලබාගත් හෝ සපයන ලද භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා ගෙවා, බිල්පත් ගත කොට හෝ සැපයුම් කරු සමග නිල වශයෙන් එකඟ නොවූ වගකීමක් නිර්වචනය කෙරේ. ඒ අනුව, ඉහත නිර්වචනයට අනුව IIFA සඳහා දැරිය යුතු පිරිවැය ලෙස දැක්වෙන අගය උපචිත පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

**2.8 බදු අයකිරීම**

1979 අංක 28 දරන දේශීය ආදායම් බදු පනතේ 8 (අ) වගන්තිය මගින්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ආදායම් බදු අයකර ගැනීමෙන් නිදහස්කරන ලදි. කෙසේ නමුත්, 2002 අංක 10 දරන දේශීය ආදායම් බදු සංශෝධන පනත ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ආපසු එවුම් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

**2.9 වෙනත් ආදායම්**

අනෙකුත් සියලු ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ. වෙළඳ දායකත්වය මගින් දැක්වෙන්නේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් සංවිධිත විදේශ වෙළඳ ප්‍රදර්ශනයන්ට සහභාගී වූවන් ගෙන් පිරිවැය අයකර ගනු ලැබීමය.

**2.10 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ '' මුදල් ප්‍රවාහ ප්‍රකාශ'' ප්‍රමිතිය මත පදනම්ව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ 'වක්‍ර ක්‍රමවේදය' යොදා ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරන ලදි. මුදල් සහ මුදල් සමාන සමන්විත වන්නේ ප්‍රසිද්ධ මුදල්වලට හැරවිය හැකි සහ අගයේ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් අවදානම් අඩු කෙටි කාලීන සහ ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජනයි. අත ඇති මුදල් සහ බැංකුවේ ඇති ශේෂයන්ගෙන් මුදල් සහ මුදල් සමාන සමන්විතය.

03.0 මුදල් සහ මුදල් සමාන

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| බැංකුවේ ඇති මුදල් - ප්‍ර.කා - ප්‍රධාන ගිණුම | 728,520,593.19 | 141,288,205.78 |
| බැංකුවේ ඇති මුදල් - ප්‍ර.කා - පෞද්ගලික අංශය | 85,980,601.90 | 29,929,681.65 |
| බැංකුවේ ඇති මුදල් - මහනුවර | 391,507.68 | 482,293.33 |
| බැංකුවේ ඇති මුදල් - බැංකු හුවමාරු | 5,105,096.42 | 5,673,237.95 |
| විදේශීය කාර්යාලය - එ.රා | (222,918.53) | 5,399.43 |
| විදේශීය කාර්යාලය - ඉන්දියාව | 78,700.36 | 78,700.36 |
| **සමස්ත මුදල් සහ මුදල් සමාන** | **819,853,581.02** | **177,457,518.50** |

04.0 අයවිය යුතු

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| පාරිභෝගික පොත් පිංච - එ.රා | 3,304,920.00 | 3,304,920.00 |
| ඉන්ධන තැන්පතු | 100,000.00 | 100,000.00 |
| වාහන කුලී තැන්පතු | 20,000.00 | 20,000.00 |
| ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම | - | 153,025.05 |
| පිරිවැය ප්‍රතිපූර්ණය | 2,557,792.08 | 900,000.00 |
| නාවාරෝහණ අධිභාරය | 123,461,589.83 | 198,843,773.23 |
| සංචාරක සංවර්ධන අධිභාරය | 211,152,119.56 | 167,072,332.82 |
| වෙනත් | 12,732.50 | - |
| **සමස්ත අයවිය යුතු ප්‍රමාණය** | **340,609,153.97** | **370,394,051.10** |

05.0 අත්තිකාරම්

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| දේශීය අත්තිකාරම් | 2,005,987.50 | 1,650,378.88 |
| විදේශීය අත්තිකාරම් | 1,397,105.70 | 377,791.54 |
| **සමස්ත අත්තිකාරම්** | **3,403,093.20** | **2,028,170.42** |

06.0 පෙරගෙවුම්

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| සේවා ගිවිසුම | - | 40,259.37 |
| මූල්‍ය දායකත්වය | 56,304.78 | 1,500,000.00 |
| වාර්ෂික සාමාජිකත්වය - එක්සත් රාජධානිය | 174,819.07 | - |
| **සමස්ත පෙරගෙවුම්** | **231,123.85** | **1,540,259.37** |

07.0 ණය ගැතියෝ

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| විවිධ ණය ගැතියෝ - SLTDA | 31,141,767.55 | 30,967,542.30 |
| විවිධ ණය ගැතියෝ - SLITHM | 658,734.30 | 208,171.60 |
| සේවකයෝ - ණය සහ අත්තිකාරම් | 2,267,240.00 | 1,975,855.00 |
| **සමස්ත ණය ගැතියෝ** | **34,067,741.85** | **33,151,568.90** |

8.0 දේපළ, යන්ත්‍ර සහ උපකරණ

| විස්තරය | 01. 01. 2011 දිනට ශේෂය | එකතු කිරීම් 2011 | මාරු කිරීම් 2011 | 31.12.2011 දිනට ශේෂය | 2011.01.01 දිනට උපචිත ක්ෂයවීම් | 2011 වසර සඳහා ක්ෂයවීම් | 2011 අපහරණය මත ක්ෂයවීම | 31.12.2011 දිනට උපචිත ක්ෂයවීම් | 31.12.2011 දිනට ශුද්ධ පොත් අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | Rs | Rs | Rs | Rs | Rs | Rs | Rs | Rs | Rs |
| දුරකථන | 437,500.00 | 281,923.00 | 11,600.00 | 707,823.00 | 46,453.04 | 35,751.71 | 2,605.79 | 79,598.96 | 628,224.04 |
| කාර්යාල උපකරණ | 2,758,021.00 | 338,205.00 | 113,703.50 | 2,982,522.50 | 508,827.13 | 207,048.69 | 37,549.55 | 678,326.27 | 2,304,196.23 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 8,535,141.89 | 13,490.00 | 16,100.00 | 8,532,531.89 | 1,728,119.03 | 638,841.97 | 4,508.00 | 2,362,453.00 | 6,170,078.89 |
| වෙනත් උපකරණ | 809,135.35 | - | - | 809,135.35 | 135,029.22 | 60,685.20 | - | 195,714.42 | 613,420.93 |
| රථ වාහන | 7,400,000.00 | - | - | 7,400,000.00 | 3,300,000.00 | 1,850,000.00 | - | 5,150,000.00 | 2,250,000.00 |
| පරිගණක උපකරණ | 8,724,079.81 | 920,164.00 | 465,210.00 | 9,179,033.81 | 6,309,523.77 | 1,067,335.16 | 421,052.21 | 6,955,806.72 | 2,223,227.09 |
| පරිගණක මෘදුකාංග | 867,750.00 | - | - | 867,750.00 | 129,025.46 | 65,081.25 | - | 194,106.71 | 673,643.29 |
| වායු සමීකරණ | 717,900.00 | - | - | 717,900.00 | 40,924.65 | 53,842.50 | - | 94,767.15 | 623,132.85 |
| **සමස්තය** | **30,249,528.05** | **1,553,782.00** | **606,613.50** | **31,196,696.55** | **12,197,902.30** | **3,978,586.48** | **465,715.55** | **15,710,773.23** | **15,485,923.32** |

## 9.0 පූර්ව ආදායම්

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| විදේශ වෙළඳ ණය | 5,585,302.75 | 7,417,059.71 |
| **සමස්ත පූර්ව ආදායම්** | **5,585,302.75** | **7,417,059.71** |

## 10.0 ගෙවිය යුතු තැන්පතු

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| නැවත ගෙවන ටෙන්ඩර් තැන්පතු | 353,080.00 | 357,330.00 |
| ගෙවිය යුතු රඳවාගැනීම් | 193,553.40 | 620,737.08 |
| වෙනත් | 6,034.34 | - |
| **ගෙවිය යුතු සම්පූර්ණ තැන්පතු** | **552,667.74** | **978,067.08** |

## 11.0 සේවක ප්‍රතිලාභ

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ විශ්‍රාමික පාරිතෝෂික ප්‍රතිපාදන | 5,004,637.50 | 4,741,257.50 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 991,715.13 | 346,540.00 |
| ගෙවන ලද පාරිතෝෂික | - | (83,160.00) |
| **සමස්ත සේවක ප්‍රතිලාභ** | **5,996,352.63** | **5,004,637.50** |

## 12.0 ණය ගැතියෝ

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| විවිධ ණය ගැතියෝ - IIFA | - | 141,701,672.99 |
| විවිධ ණය ගැතියෝ - SLTDA | 25,334,176.74 | 43,854,168.51 |
| විවිධ ණය ගැතියෝ - SLTTHM | 54,179.00 | 217,458.50 |
| **සමස්ත ණය ගැතියෝ** | **25,388,355.74** | **185,773,300.00** |

## 13.0 වෙනත් ආදායම්

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| සාහිත්‍ය සහ ඡායාරූප ද්‍රව්‍යයන්ගෙන් ලත් ආදායම් | 86,900.00 | 358,563.00 |
| පොලියෙන් ලත් ආදායම් - කාර්යමණ්ඩල ණය | 68,503.38 | 60,442.69 |
| වෙළඳ දායකත්වය | 59,722,990.34 | 41,109,717.28 |
| IIFA අනුග්‍රාහකත්වය සහ ප්‍රවේශ පත් අලෙවිය | - | 30,976,568.47 |
| වෙනත් | 4,366,284.53 | 6,954,299.28 |
| **සමස්ත වෙනත් ආදායම්** | **64,244,678.25** | **79,459,590.72** |

14.0 වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ

| විස්තරය | 2011 (රුපියල්) | 2010 (රුපියල්) |
|---|---|---|
| වේතන සහ දීමනා | 18,224,499.97 | 16,040,469.29 |
| නිවාඩු දීමනා | 53,340.25 | 38,846.80 |
| අතිකාල | 688,560.15 | 601,333.55 |
| සේවක අර්ථ සාධක අරමුදල සඳහා මණ්ඩලයේ දායකත්වය | 1,995,798.39 | 1,813,437.37 |
| සේවක භාරකාර අරමුදල සහ මණ්ඩලයේ දායකත්වය | 400,057.85 | 374,056.64 |
| කාර්ය මණ්වල සුභසාධනය | 2,314,418.32 | 985,540.19 |
| ගමන් වියදම් - දේශීය | 39,772.00 | 29,414.50 |
| පැමිණීමේ දිරිදීමනා | - | 570,453.85 |
| කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 145,461.00 | 109,200.00 |
| පාරිතෝෂික | 991,715.13 | 346,540.00 |
| රක්ෂණය | 696,531.25 | 761,643.92 |
| කාර්ය මණ්ඩල පුහුණුවීම් | 570,851.58 | 750,342.35 |
| **සමස්ත වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ** | **26,121,005.89** | **22,421,278.46** |

15.0 සමස්ත සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ

| විස්තරය | 2011 (රුපියල්) | 2010 (රුපියල්) |
|---|---|---|
| විවිධ සැපයුම් | 84,505.00 | 286,922.89 |
| ලිපිද්‍රව්‍ය | 1,150,805.98 | 1,303,748.80 |
| මුද්‍රණ සහ ප්‍රකාශන | - | 32,000.00 |
| දුරකථන සහ අන්තර්ජාල | 1,678,422.78 | 1,674,634.34 |
| තැපැල්, භාණ්ඩ යැවුම් සහ මුද්දර ගාස්තු | 3,030,129.65 | 5,130,380.04 |
| ගොඩනැගිලි කුලිය | 11,686,184.00 | 10,646,376.12 |
| විදුලිය | 3,053,054.86 | 2,478,853.62 |
| උපකරණ නඩත්තු කිරීම | 2,749,896.98 | 1,335,206.50 |
| දැන්වීම් - සාමාන්‍ය | 194,790.00 | 2,312,012.45 |
| වාහන නඩත්තු සහ අළුත් වැඩියාව | 1,133,562.42 | 601,978.79 |
| වාහන කුලියට ගැනීම් | 2,354,077.95 | 1,701,237.50 |
| ජලය | 1,036,670.88 | 211,609.70 |
| පොත් සහ සඟරා | 128,312.50 | 300,287.80 |
| ඉන්ධන ලාස්තු | 779,692.25 | 730,914.50 |
| විනෝද වියදම් දේශීය | 105,713.42 | 147,122.07 |
| පිරිසිදු කිරීම් සැපයීමේ සේවා | 1,067,312.29 | 908,916.46 |
| ආරක්ෂක ගාස්තු | 445,678.86 | 498,578.46 |
| ගොඩනැගිලි නඩත්තු කිරීම | 613,347.79 | 211,227.00 |
| රේට් සහ බලපත්‍ර | 5,430.00 | 2,922.00 |
| මෙනු සහ මල් | 240,110.00 | 90,750.00 |
| ගොඩනැගිලි වැඩිදියුණු කිරීම | - | 4,098,784.41 |
| **යොදාගත් සමස්ත සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ** | **31,537,697.61** | **34,704,463.45** |

16.0 වෙළඳාමට අදාළ පිරිවැය - විදේශීය

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| පරිපාලනය - එ. රාජධානිය | 30,805,777.48 | 29,910,841.62 |
| **සමස්ත වෙළඳාමට අදාළ පිරිවැය - විදේශීය** | **30,805,777.48** | **29,910,841.62** |

17.0 වෙළඳාමට අදාළ පිරිවැය - දේශීය

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| ප්‍රවර්ධන සහ දැන්වීම්කරණ- විදේශීය | 172,864,586.00 | 188,058,406.03 |
| දේශීය දැනුවත් කිරීමේ වැඩසටහන් | 48,246,815.55 | 18,706,295.85 |
| ප්‍රවර්ධන සහ දැන්වීම්කරණ- දේශීය | 22,144,984.83 | 55,887,653.67 |
| සංචාරක සන්නිවේදන ද්‍රව්‍ය නිෂ්පාදනය | 41,092,395.61 | 29,273,416.78 |
| වැඩසටහන් | 45,937,549.54 | 18,842,496.53 |
| මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සහ FAM සංචාර | 22,921,596.60 | 19,748,176.45 |
| ක්‍රමෝපායික රාමුව | - | 592,880.00 |
| රැඳවාගැනීම් ගාස්තු - මහජන සම්බන්ධතා | 22,737,070.92 | 38,784,877.91 |
| කලා කිරීමාණ කළමනාකරණ ගාස්තු | 5,464,671.05 | 7,782,554.25 |
| වෙළඳපොළ පර්යේෂණ | 1,274,931.19 | 8,578,669.82 |
| IIFA | - | 478,013,162.37 |
| වෙළඳ ප්‍රදර්ශනය ITB | 32,412,178.74 | 25,100,776.53 |
| වෙළඳ ප්‍රදර්ශනය - WTM | 35,360,792.60 | 38,333,362.71 |
| අන්තර්ජාල නඩත්තුව සහ ඊ නිවුස් | 1,242,182.46 | 2,620,191.29 |
| විසිට් ශ්‍රී ලංකා | 23,701,445.29 | 6,944,786.27 |
| රැඳවා ගැනීම් ගාස්තු - දැන්වීම්කරණ ආයතනය | - | 4,177,539.18 |
| හුවමාරු ලාභ/අලාභ | 42,924.00 | 1,219,153.86 |
| රාමායණය | - | 1,919,619.56 |
| විදේශ දූත මණ්ඩල සමග කටයුතු කිරීම | 2,102,668.06 | 5,186,021.37 |
| **සමස්ත වෙළඳාමට අදාළ පිරිවැය - දේශීය** | **477,546,792.44** | **949,770,040.43** |

18,0 වෙනත් පිරිවැය

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| මණ්ඩල සාමාජික දීමනා | 314,136.87 | 79,500.00 |
| ප්‍රසම්පාදන කමිටු සාමාජික දීමනා | 65,500.00 | 298,500.00 |
| විගණන ගාස්තු | 400,000.00 | - |
| නීති ගාස්තු | 2,316.00 | 109,615.00 |
| ආර්ථික සේවා ගාස්තු | - | 72,276.03 |
| මුද්දර ගාස්තු | 12,500.00 | 9,425.00 |
| පාඩු සහ කපාහැරීම් | 108,737.97 | (18,161.42) |
| එකතු කරන ලද අගය මත බදු | 11,443,632.64 | 43,071,919.24 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2,265,824.61 | 3,995,893.36 |
| **සමස්ත වෙනත් පිරිවැය** | **14,612,648.09** | **47,618,967.21** |

19,0 මූල්‍ය පිරිවැය

| විස්තරය | 2011 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| IIFA ණය පොළී සහ බැංකු ගාස්තු | 5,026,484.03 | 5,852,511.41 |
| බැර බදු | 172,943.48 | 1,179,242.48 |
| බැංකු ගාස්තු | 45,598.00 | 185,769.75 |
| **සමස්ත මූල්‍ය පිරිවැය** | **5,245,025.51** | **7,217,523.64** |

20, සංසන්දනාත්මක තොරතුරු

මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | පෙර ප්‍රකාශිත ශේෂය 2010.12.31 රුපියල් | ගැලපීම් 2010 රුපියල් | නැවත ප්‍රකාශිත ශේෂය **31.12.2010** රුපියල් |
|---|---|---|---|

වත්කම්

ජංගම වත්කම්

| | | | |
|---|---|---|---|
| අයවිය යුතු | 424,621,335.73 | (54,227,284.63) | 370,394,051.10 |
| අත්තිකාරම් | 4,803,676.04 | (2,775,505.62) | 2,028,170.42 |
| ණය ගැතියෝ | 33,141,568.90 | 10,000.00 | 33,151,568.90 |

ජංගම වගකීම්

| | | | |
|---|---|---|---|
| උපචිත පිරිවැය | 93,941,483.40 | (55,073,490.61) | 38,867,992.79 |
| ණය හිමියෝ | 185,352,336.26 | 420,963.74 | 185,773,300.00 |

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ආදායම්

| | | | |
|---|---|---|---|
| නාවාරෝහණ අධිභාරය | 683,451,883.18 | (12,055,437.10) | 671,396,446.08 |
| සංචාරක සංවර්ධන අධිභාරය | 359,274,914.50 | 71.71 | 359,274,986.21 |
| වෙනත් ආදායම් | 78,559,590.72 | 900,000.00 | 79,459,590.72 |

වියදම්

| | | | |
|---|---|---|---|
| වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 23,045,559.16 | (624,280.70) | 22,421,278.46 |
| සමස්ත සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ | 35,775,107.42 | (1,070,643.97) | 34,704,463.45 |
| වෙළඳාමට අදාළ පිරිවැය - විදේශීය | 32,910,539.37 | (2,999,697.75) | 29,910,841.62 |
| වෙළඳාමට අදාළ පිරිවැය - විදේශීය | 996,662,439.26 | (46,892,398.83) | 949,770,040.43 |
| වෙනත් පිරිවැය | 4,847,047.95 | 42,771,919.24 | 47,618,967.21 |

6,7,9 ..

ටීඑම්/එච්/එස්එල්ටීපීබී/එෆ්ඒ/2011 CHECKED / INITIALED Signature.... Date.... 2012 ඔක්තෝබර් 31 දින

සභාපති,
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය.

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) ( ඒ ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කාර්යාංශයේ සභාපති වෙත 2012 අගෝස්තු 08 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් සර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතතාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

CHECKED

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍ර)

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ශ්‍රී.ලං.ගි.ප්‍ර. යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| ශ්‍රී.ලං.ගි.ප්‍ර. 10 | (අ) | පෙර වර්ෂ වල දෝෂ නිවැරදි කිරීම පිණිස රු. 2,340,263 ක මුදලක් සමුච්ත අතිරික්තයට ගලපා තිබුණි. එසේ වුවත්, මෙම ගැලපීම් ශ්‍රී.ල.ගි.ප්‍ර. 10 හි සඳහන් නියමයන්ට අනුව ගිණුම්වල අනාවරණය කර නොතිබුණි. |
| | (ආ) | ඇතිවිය හැකි වගකීම පිළිගත හැකි තොරතුරු මත පදනම්ව සලකා බැලීමකින් තොරව කාර්යාංශයේ නිලධාරීන් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු මත පදනම්ව රු. මිලියන 223 ක මුදලක් උපචිත වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී වෙන් කර තිබුණි. |

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) රු. 1,167,900 කට මිලට ගෙන තිබුණු ලැප්ටොප් පරිගණක 8 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) රු. 1,150,000 ක් වූ පරිත්‍යාග මුදලක් දේශීය ප්‍රවර්ධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ජාත්‍යන්තර ඉන්දියානු චිත්‍රපටි ඇකඩමි (ජා.ඉ.චි.ඇ.) උත්සවයේ තථ්‍ය වියදම නියමිත පරිදි හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ජාත්‍යන්තර ඉන්දියානු චිත්‍රපට ඇකඩමි උලෙල සඳහා සපයන ලද භාණ්ඩ හා සේවා සඳහා රු. 120,694,122 ක මුදලක් අදාල සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ හා සේවා තථ්‍ය වශයෙන් හා නිවැරදිව ලැබුණු බවට තහවුරු කර ගැනීමකින් තොරව උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.3 නොසැසඳූ ගිණුම්

---

අදාල උපයෝගි වාර්තාවල සඳහන් ශේෂයන් සමඟ සැසඳීම් නොකිරීම නිසා කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන හා අදාල උපයෝගි වාර්තා අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| විස්තරය | මුලා ප්‍රකාශන අනුව ශේෂය | උපයෝගි වාර්තා වල විස්තරය | උපයෝගි වාර්තා අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | රු. | | රු. | රු. |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට (ශ්‍රී.ලං.සං.හෝ.ක.ආ) ගෙවිය යුතු | 54,179 | ශ්‍රී.ලං.සං.හෝ.ක. ආයතනයේ ගිණුම් | 734,655 | 680,476 |
| ශ්‍රී.ලං.සං.හෝ.ක. ආයතනයෙන් ලැබිය යුතු | 658,734 | - එම - | නැත | 658,734 |

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉන්දියානු විශ්‍රපට ඇකඩමි සම්මාන උළලේ සංවිධායක ආයතනයෙන් ලැබිය යුතු මුදල් එම ආයතනයෙන් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු වලට අනුව, ඉහත ආයතනය වෙනුවෙන් කාර්යාංශය ලබා දී තිබුණු හෝටල් කාමර පහසුකම් වෙනුවෙන් එම ආයතනයෙන් දල වශයෙන් රු. මිලියන 20 ක් අයකර ගත යුතුව තිබුණි.

(ආ) එක්සත් රාජධානියේ කාර්යාලයෙන් ලැබිය යුතු රු. 3,304,920 ක් අදාල වගකිවයුතු නිලධාරීන්ගෙන් වර්ෂ 2 ක වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිලි නවීකරණය වෙනුවෙන් කාර්යාංශය දරා තිබුණු රු. 28,047,842 ක ප්‍රාග්ධන වියදම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මාධ්‍යවේදීන් පැමිණීමේ වැඩ සටහනට අදාල ක්‍රියාත්මක කල වැඩ සටහන් සංඛ්‍යාව හා මාධ්‍යවල පල කිරීම් විස්තර, විස්තරාත්මක උපලේඛන, සත්‍යාපන වාර්තා, ලදුපත් හා ඉන්වොයිසි, ගුවන් ගමන් පහසුකම් භාවිතා කල අයගේ විස්තර, උපයෝගි ලියවිලි යනාදි සාක්ෂි නොවීම නිසා ගිණුම්වල වූ එකතුව රු. 107,416,107 ක වියදම් හතක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කල නොහැකි විය.

2.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ චක්‍රලේඛය. | |
| (i) 6 පරිච්ඡේදයේ 6.5.1 වගන්තිය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2012 ජූලි 31 දින දක්වා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 9 පරිච්ඡේදයේ 9.12 වගන්තිය | ව්‍යාපාරයක් විසින් අනුගමනය කරනු ලබන ඕනෑම සුභ සාධන යෝජනා ක්‍රමයක් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවත්, කාර්යාංශයේ සේවක වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා එම අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iii) 9 පරිච්ඡේදයේ 9.14.1 වගන්තිය | මානව සම්පත් කළමනාකරණයට අදාල රීති හා රෙගුලාසි පිළිබඳව සියලු කරුණු ඇතුලත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පරිච්ඡේදයක් සහිත පරිපාටි සංග්‍රහය භාණ්ඩාගාර ලේකම්ගේ එකඟත්වය සහිතව පාලක මණ්ඩලය විසින් අනුමත කල යුතු වුවත් කාර්යාංශය මෙම නියමයන් අනුගමනය කර නොතිබුණි. |
| (ආ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 4 පරිච්ඡේදයේ 4.2.1 (අ) සහ (ඇ) වගන්ති. | අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් ආවරණය වන පරිදි ඉදිරි වර්ෂය සඳහා විස්තරාත්මක සැලැස්මක් සමඟ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වුවත්, එම නියමය පරිදි කාර්යාංශය විසින් එසේ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් චක්‍රලේඛයේ අවශ්‍යතාවය පරිදි පවත්වා නොතිබුණි. |

CHECKED

| | | |
|---|---|---|
| (ඇ) | 2008 ජනවාරි 11 දිනැති අංක පීඊඩී/56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉදිරි මාස 06 ක කාලපරිච්ඡේදයක් සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සැලකිල්ලට ගත් පසුව 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන වෙත ඇති අතිරේක මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුය. එසේ වුවත් කාර්යාංශයේ අතිරේක මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. විගණනය විසින් කරන ලද ගණනය කිරීම්වලට අනුව සමාලෝචිත වර්ෂයේ අතිරේක මුදල් ප්‍රමාණය රු. මිලියන 500 ක් පමණ විය. |
| (ඉ) | 2008 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | චක්‍රලේඛ නියමයන්ට අනුව, කාර්යාංශයේ කළමනාකාර අධ්‍යක්ෂවරයාට මාසයක් තුලදී උපරිම වශයෙන් ඉන්ධන ලීටර් 120 ක් ලබාගත හැකිය. එසේ වුවත්, චක්‍රලේඛ නියමයන් නොසලකා කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් මාසයකට ඉන්ධන ලීටර් 207 ක් පමණ ලබාගෙන තිබුණි. |
| (ඊ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/ඊඑන්/2011/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | රජයේ ආයතනයට හෝ රජයේ සංවර්ධන ව්‍යාපෘතියකට හැර, වාර්ෂිකව අනුමත වැඩ සටහන මගින් රු. 100,000 ට වඩා වැඩි ආධාර/ පරිත්‍යාග සිදු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාරයක් විසින් ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. මෙම අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශය විසින් රු. 1,150,000 ක් පෞද්ගලික සංවිධාන දෙකකට ලබා දී තිබුණි. |
| (උ) | මුදල් රෙගුලාසි අංක 371 | අවස්ථා දහතුනකදී රු. 20,000 උපරිම සීමාව ඉක්මවා රු. 7,882,940 ක අත්තිකාරම් නිලධාරීන්ට ලබාදී තිබුණි. |
| (ඌ) | ආයතන සංග්‍රහයේ VI පරිච්ඡේදයේ 2.10 වගන්තිය. | කාර්යාංශයේ බඳවා ගැනීම් මාරු කිරීම්, උසස් කිරීම්, වැටුප් වර්ධක ගෙවීම්, සේවකයින්ට එරෙහි විනය ක්‍රියාමාර්ග යනාදියට අයත් ලිපි පිටපත් විගණනයට ඉදිරිපත් කල යුතුය. එසේ වුවද කාර්යාංශය විසින් එම ලිපි පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

2.2.7 අධිකාර බලය නොලත් ගනුදෙනු

---

පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව, එක්සත් ජනපද කාර්යාලය සඳහා නිලධාරීන් තිදෙනෙකු බඳවා ගෙන ඔවුන් සඳහා රු. 3,786,970 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

CHECKED

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු. 658,411,571 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 12,280,470 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.646,131,101 වර්ධනයක් දැක්වුණි. රු. 138,128,082 කින් සංචාරක සංවර්ධන හා ආගමන බදු සහ වෙනත් ආදායම් වැඩිවීම සහ දේශීය ප්‍රවර්ධන වියදම් රු. 472,233,248 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩිවීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ ආදායම රු. මිලියන 1,248 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු. මිලියන 1,110 සමඟ සැසඳීමේදී 12% ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ සංචාරක ප්‍රවර්ධන වියදම් වෙනුවෙන් වැය කර තිබුණු රු. මිලියන 1,098 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී ඒ සඳහා රු. මිලියන 590 ක් වැයකර තිබුණි. මේ අනුව 86% ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සමාලෝචිත වර්ෂය සැසඳීමේදී කාර්යාංශයේ ආදායම් හා වියදම් වල වෙනස්වීම් පහත දැක්වේ.

| | 2011 රු. (මි) | 2010 රු. (මි) | වෙනස රු. (මි) | % |
|---|---|---|---|---|
| ආගමන හා සංචාරක සංවර්ධන හා බදු | 1,184 | 1,030 | 154 | 15 |
| වෙනත් ආදායම් | 64 | 79 | 15 | 23 |
| පරිපාලන වියදම් | 58 | 57 | 01 | 1.7 |
| සංචාරක ප්‍රවර්ධන වියදම් | 508 | 979 | 472 | 93 |
| ක්ෂය හා වෙනත් වියදම් | 24 | 61 | 37 | 154 |
| ශුද්ධ අතිරික්තය | 658 | 12 | 646 | 5,383 |

3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

| ස්කන්ධ අනුපාත | සම්මත අනුපාතය | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| ජංගම අනුපාතය | 2.1 | 4.63 | 2.47 | 1.73 |
| ක්ෂණික අනුපාතය | 1.1 | 4.60 | 2.45 | 1.71 |

CHECKED

ඉකුත් වර්ෂ දෙක සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික අනුපාත ක්‍රමයෙන් ඉහළ ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මුළු ජංගම වත්කම් වලින් පිළිවෙලින් 68% ක් හා 30% ක් මුදල් හා මුදල් හා සමාන වත්කම්වලින් නියෝජනය විය. එසේ වුවත්, විධිමත් මුදල් කළමනාකරණයක් නොවීම නිසා අතිරික්ත මුදල් දිගු කාලීන සහ මධ්‍ය කාලීන ආයෝජන වල යොදවා නොතිබුණි. සමාලෝචිත වර්ෂය මුළුල්ලේ රු. මිලියන 500 කට වැඩි අතිරික්ත මුදල් බැංකු ගිණුම්වල පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 4.1 අලෙවිකරණ හා ප්‍රවර්ධන කටයුතු පිළිබඳ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු. මිලියන 508 ක් සහ රු. මිලියන 979 ක් අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු සඳහා කාර්යාංශය වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ඇතැම් ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක්සත් රාජධානි කාර්යාලයේ කටයුතු:

නියැදි විගණන පරීක්ෂණයකට අනුව එක්සත් රාජධානියේ උප කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී එක්සත් රාජධානි සහ අයර්ලන්ත කාර්යාල විසින් ඒකාබද්ධ අලෙවිකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිවෙලින් රු. 1,613,571 ක් සහ රු. 6,973,111 ක් වැය කර තිබුණි. එසේ වුවත්, කටයුතු වලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාකරගත් බව ඇගයීමකට ලක්කර නොතිබුණි.

(ii) කාර්යාංශයේ පර්පාටි වලට අනුව, වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය හා ප්‍රතිඵල පිළිබඳ විශ්ලේෂණ සහ පිරිවැය ඇස්තමේන්තු සකස් කර පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙයට අමතරව, වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට තෝරාගත් ආයතන සමඟ ගිවිසුම් ඇතිකර ගෙන නොතිබුණි.

(iii) කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ අනුමැතියකින් තොරව හා හදිසි අවශ්‍යතාවයක් ලෙස දක්වා ප්‍රචාරන පත්‍රිකා 2000 ක් රු. 519,000 ක් වැය කර මුද්‍රණය කර තිබුණි. ප්‍රචාරණ පත්‍රිකාවල තේමාව සහ එම පත්‍රිකා උපයෝජනය පිළිබඳ විස්තර ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මාධ්‍යකරුවන් පැමිණීමේ සහ සංචාරයන් සඳහා හුරු කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

(i) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණු ඉහත වැඩ සටහන් සඳහා රු. මිලියන 22.9 ක් වැය කර තිබුණි. උපරිම ප්‍රතිලාභ රටට ලබාදීම පිණිස, සුදුසු සහ වාසිදායක මධ්‍යකරුවන් තෝරා ගැනීම මුල් කර ගත් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කළ යුතු වැඩ සටහන්

CHECKED

සංඛ්‍යාව සැලසුම් කර නොතිබුණි. මේ අනුව, විධිමත් මාධ්‍යය තෝරා ගැනීමේ සැලසුමකින් තොරව තත්කාර්ය පදනමකින් වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී මාධ්‍යකරුවන් පැමිණීමේ වැඩ සටහන සඳහා මාධ්‍යකරුවන් 183 ක් සහභාගි වී තිබුණි. එසේ වුවත්, අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීම පිණිස වැඩසටහන් සඳහා මාධ්‍යකරුවන් තෝරා ගැනීමේ නිර්ණායක තීරණය කර නොතිබුණි.

(iii) මෙම වැඩ සටහන සඳහා රු. මිලියන 22.9 ක් වැය කර තිබුණද විදේශ මාධ්‍ය කරුවන් විසින් අපේක්ෂිත පරිදි මාධ්‍ය ප්‍රචාරයක් ලබා දුන් බවට සාක්ෂි නොතිබුණි.

(ඇ) ඉන්දියානු විත්‍රපට ඇකඩමි සම්මාන උළෙල -ඉ.වි.ඇ.ස.

රු. මිලියන 478 ක් මෙම උළෙල සඳහා වැය කර තිබුණු අතර, මුළු වියදමෙන් රු. මිලියන 141 ක් සමාලෝචිත වර්ෂයේදී උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. පහත දක්වා ඇති පරිදි, ඉකුත් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද ඇතැම් කරුණු සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් වී නොතිබුණි.

(i) ඉන්දියානු විත්‍රපට ඇකඩමි සම්මාන උළෙලේ ක්‍රිකට් තරගාවලිය:

- මුද්‍රණය කල ප්‍රවේශපත්‍ර ප්‍රමාණය, ඒවායේ අනුක්‍රමික අංක හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම් භාර ගැනීම යනාදියට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
- ගරු අමාත්‍යවරයා ලබාදී තිබුණු නියෝග වලට පටහැනිව ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමේ කටයුතු පෞද්ගලික සමාගමකට පවරාදී තිබුණි.
- සමාගම විසින් එකතු කර තිබුණු රු. 12,826,500 ක මුදලින් රු. 9,929,490 ක් ක්‍රීඩා පිටියේ වියදම් ලෙස වැය කර තිබුණි.
- තරගාවලියේ අරමුණට අනුව පුණ්‍ය කටයුතු සඳහා යොදා ගැනීම පිණිස රු. 2,554,609 ක මුදලක් යුනිසෙෆ් ආයතනයට භාරදීම සඳහා සමාගම විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලබාදී තිබුණි. එසේ වුවත්, මෙම මුදල යුනිසෙෆ් ආයතනයට භාරදුන් බවට අදාල සාක්ෂි නොතිබුණි.
- මෙයට අමතරව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙනමම එකතු කර තිබුණු රු. 7,897,000 ක ප්‍රවේශපත්‍ර ආදායමක් කාර්යාංශයට හෝ සමාගමට භාරදී නොතිබුණි.

(ii) ගුවන් ගමන් පහසුකම් සැපයීම:

සහභාගිවූවන් 436 ක් පමණක් කාර්යාංශයෙන් සපයන ලද ගුවන් ගමන් පහසුකම් ලබාගෙන තිබුණි. එසේ වුවත් අවශ්‍ය කරන ගුවන් යානා ප්‍රමාණය සැලකිල්ලට ගැනීමකින් තොරව කුලී ගුවන් යානා හතරක් රු. මිලියන 58.8 ක අතිරේක පිරිවැයක් දරා ලබාගෙන තිබුණි. විගණනය විසින් කරන ලද විමර්ශනයකට අනුව, ඉන්දියානු විත්‍රපට ඇකඩමි සම්මාන උළෙල සඳහා පැමිණි 09 දෙනෙකු 2012 සැප්තැම්බර් 30 දින දක්වා එනම් වර්ෂ 02 කාලයක් ගත වූ පසුවද රටින් බැහැර වී නොතිබුණි. මෙම නිසා ඉන්දියානු විත්‍රපට ඇකඩමි සම්මාන උළෙල විගණනයට ඉදිරිපත් කර තිබුණු උළෙල සඳහා සහභාගිවූවන්ගේ නම් ලැයිස්තුව ව්‍යාජ

CHECKED

ලේඛණයක් බව පෙනී යයි. මේ නිසා ගුවන් ගමන් වියදම් වල නිවැරදිභාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(iii) ගොඩබිම් ගමන් පහසුකම් සැපයීම:

ගොඩබිම් ගමන් සඳහා අයවැයගත මුදල රු. මිලියන 8 ක් විය. එසේ වුවත් සාමාන්‍ය හා සුඛෝපභෝගී වාහන සැපයීම වෙනුවෙන් පිළිවෙලින් රු. මිලියන 15 ක් සහ රු. මිලියන 2.5 ක් වැයකර තිබුණි. වාහන අංක, පිටත් වූ පැමිණි වේලාවන් සහ ගමන් කල ස්ථාන යනාදී මූලික තොරතුරු නොමැතිව ගෙවීම් සිදුකර තිබුණි. මේ නිසා ගෙවීම්වල නිවැරදිභාවය සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය

(iv) නවාතැන් පහසුකම් සැපයීම:

විගණනයට ලැබුණු තොරතුරු වලට අනුව, උළෙල සඳහා අමුත්තන් 450 ක් සහභාගී වී තිබුණි. මේ අනුව අමුත්තන්ට දින 4 ක කාලයක් නවාතැන් ගැනීම සඳහා රාත්‍රී නවාතැන් දින 1800 (450x4) ක ප්‍රමාණයක් ප්‍රමාණවත් විය යුතුව තිබුණි. එසේ වුවත්, රාත්‍රී නවාතැන් දින 3,784 ක් භාවිතා කර තිබුණි. කාමර භාවිතා කල සහභාගිවූවන්ගේ සහ අමුත්තන්ගේ විස්තර නොමැති වීම නිසා මෙවැනි රාත්‍රී නවාතැන් දින සංඛ්‍යාවක් භාවිතා කර තිබීම නාස්තිකාර වියදමක් ලෙස නිරීක්ෂණය වේ.

## 4.2 අරමුදල් ඌණ උපයෝජනය

සමාලෝචිත වර්ෂය තුලදී නිශ්චය කරන ලද රටවල් ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 149 ක් වෙන්කර තිබුණද, අවිධිමත් මෙහෙයුම් සැලසුම් හේතුවෙන් රු. මිලියන 57 ක් පමණක් වැඩසටහන් සඳහා උපයෝජනය කර තිබුණි.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

තථ්‍ය අවශ්‍යතාවය සඳහා කාර්යාංශයේ අරමුදල් ප්‍රමාණය ඇගයීමකින් තොරව ඉන්දියානු චිත්‍රපට ඇකඩමි සම්මාන උළෙල සඳහා රු. මිලියන 200 ක බැංකු ණය මුදලක් 2010 ජුනි 02 දින ලබාගෙන තිබුණි. රු. මිලියන 120 ක් රු. 300,000 ක පොලියකුත් සමඟ දින 20 කට පසුව ආපසු ගෙවා තිබුණි. ඉතිරි ශේෂය වූ රු. මිලියන 80 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. 2011 නොවැම්බර් අවසානය දක්වා රු. මිලියන 10.9 ක මුදලක් පොලිය ලෙස ගෙවා තිබුණු අතර 2011 නොවැම්බර් දක්වා වර්ෂ දෙකකට වැඩි කාලයක් රු. මිලියන 80 ක ණය ශේෂය නිෂ්කාර්ය වත්කමක් ලෙස තබාගෙන තිබුණි.

CHECKED

6. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අලෙවිකරණ හා ප්‍රවර්ධන කටයුතු
(ආ) විදේශ රටවල පිහිටුවන ලද උපකාර්යාල කළමනාකරණය
(ඇ) අයවැය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) ප්‍රසම්පාදනයන්
(උ) අභ්‍යන්තර විගණනය
(ඌ) ගිණුම්කරණය හා පොත් තැබීම
(එ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
(ඒ) අත්තිකාරම් ගෙවීම්.

එච්.ඒ.එස්. සමරවීර

විගණකාධිපති

CHECKED